මගේ අංකය : PTF / SO / Sub Committees / 20
දිනය : 2021.02.16

**ආර්.ඩබ්.ආර්.පේමසිරි මහතා**
ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය
අනු කමිටු ලේකම්, ජාතික සම්බන්ධීකරණ යටිතල පහසුකම් අනු කමිටුව

**ජේ.ජේ.රත්නසිරි මහතා**
ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
අනු කමිටු ලේකම්, ජාතික සම්බන්ධීකරණ මහජන ආරක්ෂාව හා සමාජ සංවර්ධන අනු කමිටුව

**අනුර දිසානායක මහතා**
ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
අනු කමිටු ලේකම්, ජාතික සම්බන්ධීකරණ කෘෂිකාර්මික අනු කමිටුව

**එම්.පී.ඩී.යූ.කේ.මාපා පතිරණ මහතා**
ලේකම් , කම්කරු අමාත්‍යාංශය
අනු කමිටු ලේකම්, ජාතික සම්බන්ධීකරණ ජීවනෝපාය අනු කමිටුව

**එස්.එච්. හරිස්චන්ද්‍ර මහතා**
ලේකම්, දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
අනු කමිටු ලේකම්, ජාතික සම්බන්ධීකරණ සමාජ යටිතල පහසුකම් අනු කමිටුව

**"ගම සමඟ පිළිසඳරක් තුළින් වැඩ සමඟ යළි ගමට" - 2021 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම ජාතික සම්බන්ධීකරණ අනු කමිටු පිහිටුවීම**

නව සංවර්ධන ප්‍රවේශයක් සඳහා එළඹෙමින්, ග්‍රාමීය ජනතාවගේ අවශ්‍යතා සහ ප්‍රතිපත්ති සම්පාදනය එකිනෙක යා කරමින්, මෙතෙක් නොවිසඳුනු ජනතා ගැටලු විසඳීමේ අරමුණින් සියලු කැබිනට් හා රාජ්‍ය අමාත්‍යවරුන්ගෙන් සැඳුම්ලත් ජාතික සම්බන්ධීකරණ අනු කමිටු, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2021.02.03 දින අරලියගහ මන්දිරයේදී පැවැති රැස්වීමේ දී පිහිටුවන ලදී.

02. ඒ අනුව, 2021.02.10 හා 11 දිනයන්හි ජනාධිපති කාර්යසාධන බලකායේ සභාපති, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී රැස් වූ එක් එක් අනු කමිටු රැස්වීම්වලදී එම අනු කමිටුවලට සභාපතිවරුන් හා අනු කමිටු ලේකම්වරුන් පත්කර ගන්නා ලදී. ඒ අනුව, පත්කර ගත් ජාතික සම්බන්ධීකරණ අනු කමිටුවල සභාපතිවරුන්, අනු කමිටු ලේකම්වරුන්, රැස්වීම් පැවැත්වෙන ස්ථාන, ජනාධිපති කාර්යසාධන බලකායේ සම්බන්ධීකරණ ලේකම්වරුන් සහ සම්බන්ධීකාරකවරුන් යනාදී විස්තර ඔබගේ ද දැනගැනීම සඳහා **ඇමුණුම - 01** හි සඳහන් කර ඇත.

03. ජාතික සම්බන්ධීකරණ අනු කමිටු නියෝජනය කරන කැබිනට් හා රාජ්‍ය අමාත්‍යාංශවල අමාත්‍යවරුන්ගේ නාම ලේඛනය **ඇමුණුම - 02** මගින් දක්වා ඇත. මෙම අනු කමිටුවල විෂය පථයන්, එක් එක් අමාත්‍යාංශවල විෂය පථයන් ඒකාබද්ධ කරමින් සකස් කර **ඇමුණුම - 03** ලෙස මේ සමඟ අමුණා ඇත.

04. මෙම ජාතික සම්බන්ධීකරණ අනු කමිටු වලට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව යටතේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනු කමිටු 5ක් ස්ථාපිත කරන ලෙස ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දන්වා ඇත. එම අනු කමිටුවල විෂය පථයන් හා එම අනු කමිටු නියෝජනය කරන නිලධාරීන්ගේ ලේඛනයක් **ඇමුණුම - 04** මගින් ඉදිරිපත් කර ඇත.

05. ජාතික සම්බන්ධීකරණ අනු කමිටු මාසිකව රැස්වෙන හෙයින්, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලින් ලැබෙන යෝජනා හා ගැටලු ඇතුළුව "ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමේ ජාතික වැඩසටහන" යටතේ දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන රැස්වීම් මාලාවේදී අන්තර් අමාත්‍යාංශයීය මට්ටමින් හා ජාතික මට්ටමින් ඔබ අනු කමිටුවට අදාළ අමාත්‍යාංශ හා ආයතන ඒකාබද්ධ වී විසඳාලිය යුතු ගැටලු මෙහිදී සාකච්ඡා කර කඩිනමින් විසඳුම් ලබා දීම අපේක්ෂා කරයි. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මට්ටමින් විසඳාලිය හැකි ගැටලු එම කමිටුවලින්ම විසඳීමට උපදෙස් ලබාදීම හා බලය පැවරීම වඩාත් සුදුසුය. එමගින්, ජාතික සම්බන්ධීකරණ අනු කමිටුවල කාර්යයන් හා කර්තව්‍යයන් නිසි පරිදි ඉටු කිරීමට ඔබට පහසුවක් වේ.

06. සෑම අනු කමිටු රැස්වීමක් ම පැවැත්වෙන දිනට පෙර සාකච්ඡා කිරීමට යෝජිත විෂයයන් පිළිබඳව අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් දැනුවත් කර, එම ගැටලුවලට අදාළ යෝජිත විසඳුම් හා යෝජනා කලින් ලබාගැනීමට කටයුතු කිරීමෙන් කමිටු රැස්වීම්වලදී ඵලදායී හා කඩිනම් තීරණ ලබාගැනීමට පහසු වේ. එහෙයින්, අනු කමිටුව නියෝජනය කරන ගරු අමාත්‍යවරුන් හා අදාළ රාජ්‍ය ආයතන ප්‍රධානීන් සම්බන්ධ කරගත් සමාජ මාධ්‍ය ජාල (WhatsApp Group) සකස් කර ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

07. මහජන ගැටලු හා අවශ්‍යතා පිළිබඳව එක් එක් ආයතන විවිධ ස්ථාවරවල පිහිටා කටයුතු කරනු වෙනුවට ජනතා අවශ්‍යතාවල මූලික හරය හා අරමුණු නිසි ලෙස අවබෝධකර ගෙන ඊට අදාළ ප්‍රතිපත්තිමය ස්ථාවරයන් පිළිබඳව ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ තම නිලධාරීන් දැනුවත් කිරීම තුළින් බොහෝ මහජන ගැටලු පහසුවෙන් විසඳාලිය හැකි බව පෙනී ගොස් ඇත. එහෙයින්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනු කමිටුවලට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ, අනු කමිටුව විසින් සාමූහිකව සකස් කර කඩිනමින් නිකුත් කිරීම සිදුකළ මැනවි.

08. සෑම මාසික අනු කමිටු රැස්වීමකින්ම පසු රැස්වීම් වාර්තාවේ පිටපතක් අනු කමිටු ලේකම්වරයාගේ අත්සනින් තම අමාත්‍යාංශයීය ලිපි ශීර්ෂයෙන් රැස්වීමට පැමිණි හා නොපැමිණි ආරාධිතයින් සියලු දෙනාටම යැවීම අත්‍යාවශ්‍ය වේ. ඒ තුළින් අනු කමිටු සියලු සාමාජිකයන්ට සාකච්ඡා කළ කරුණු හා තීරණ දැනගැනීමට හැකිවේ. තවද, සෑම රැස්වීමකදී ම පූර්ව රැස්වීමේ ගත් තීරණවල ප්‍රගතිය සොයා බැලීම කළ යුතු වේ.

09. සෑම ජාතික සම්බන්ධීකරණ අනු කමිටු රැස්වීමකට ම ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, මුදල් අමාත්‍යාංශය හා ජනාධිපති කාර්යසාධන බලකාය නියෝජනය කරමින් නියෝජිතයින් සහභාගී වේ. රැස්වීම්වල අපේක්ෂිත අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමේ ප්‍රගතිය සොයා බලා කාර්යසාධන බලකායට වාර්තා කිරීමේ වගකීම කාර්යසාධන බලකායේ නියෝජිතයින්ට පවරා ඇත.

10. එක් එක් අනු කමිටුවල විෂය පථය ආවරණය වන සේ ආංශික සැලසුම් ( Sectoral Plan) 2021-2023 සකස් කර එහි ප්‍රගතිය ත්‍රෛමාසිකව සමාලෝචනය කිරීම තුළින් ආර්ථික හා සමාජීය සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට ඉවහල් වේ. එහිදී, ප්‍රධාන වශයෙන් හුදෙක් භෞතික හා මූල්‍යමය ප්‍රගතිය මිනුමට වඩා ආර්ථික දර්ශක, සමීක්ෂණ වාර්තා, ජනමාධ්‍ය / සමාජ මාධ්‍ය හා මහජන අදහස් කෙරෙහි වැඩි නැඹුරුවක් තැබීම වැදගත් වේ.

ඒ අනුව, ජාතික සම්බන්ධීකරණ අනු කමිටුවේ කාර්යභාරය සාමූහිකව හා සාර්ථකව ඉටුකර සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට ඔබට දායක වීමට හැකි වෙතැ යි අපේක්ෂා කරමි.

**ඇන්ටන් පෙරේරා**

අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්
සම ලේකම් - ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන
ජනාධිපති කාර්යසාධන බලකාය

පිටපත්:

| | | |
|---|---|---|
| 01. | සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් | කාරුණික දැනගැනීම සඳහා |
| 02. | සියලුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් හා උප සභාපතිවරුන් | |
| 03. | සියලුම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන් | කාරුණික දැනගැනීමට සහ ගරු අමාත්‍යවරුන් දැනුවත් කිරීම පිණිස |
| 04. | සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් | |
| 05. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන් | කාරුණික දැනගැනීම සඳහා |
| 06. | සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් | |
| 07. | සියලුම නගරාධිපතිවරුන් / ප්‍රාදේශීය සභා සභාපතිවරුන් - කාරුණික දැනගැනීම සඳහා | |

**2021 - අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**
**"ගම සමඟ පිළිසඳරක් - වැඩ සමඟ යළි ගමට"**

ගම සමග පිළිසඳරක්

**ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය**

## ජාතික සම්බන්ධීකරණ අනු කමිටු

| ජාතික සම්බන්ධීකරණ අනුකමිටුව | රැස්වන දිනය හා වේලාව | පළමු රැස්වීමේ දිනය හා ස්ථානය | ජාතික සම්බන්ධීකරණ අනුකමිටු සභාපතිවරුන් | ජාතික සම්බන්ධීකරණ අනු කමිටු ලේකම්වරුන් | කාර්යසාධන බලකා සම්බන්ධීකරණ ලේකම්වරුන් හා සම්බන්ධීකාරකවරුන් |
|---|---|---|---|---|---|
| 1. කෘෂිකාර්මික අනුකමිටුව | සෑම මාසයකම දෙවන සතියේ බදාදා දින පෙ.ව. 9.00 | 2021.02.18 ප.ව.5.00<br>නිල මැදුර නාරාහේන්පිට | ගරු චමල් රාජපක්ෂ මැතිතුමා | ඩී.එම්.අනුර දිසානායක මහතා (ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය) | ශාන්ත බණ්ඩාර මහතා<br>දු.අංකය : 075 095 0531<br>ආර්.ඒ.එන්.ප්‍රියදර්ශනී මිය<br>දු.අංකය : 071 812 4161 |
| 2. ජීවනෝපාය අනුකමිටුව | සෑම මාසයකම දෙවන සතියේ බදාදා දින ප.ව. 2.00 | 2021.02.17 ප.ව.2.00<br>මහ නැගුම මහ මැදුර | ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා | එම්.පි.ඩි.යු.කේ.මාපා පතිරණ මහතා (ලේකම් , කම්කරු අමාත්‍යාංශය) | ශාන්ත බණ්ඩාර මහතා<br>දු.අංකය : 075 095 0531<br>තිළිණි පිරිස් මිය<br>දු.අංකය : 071 849 2763 |
| 3. යටිතල පහසුකම් අනුකමිටුව | සෑම මාසයකම දෙවන සතියේ (පාර්ලිමේන්තු නොමැති) අඟහරුවදා දින පෙ.ව.10.00 | 2021.02.17 ප.ව.2.30<br>මහ නැගුම මහ මැදුර | ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා | ආර්.ඩබ්.ආර්.පේමසිරි මහතා (ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය) | නිහාල් සෝමවීර මහතා<br>දු.අංකය : 077 330 8644<br>ආර්.එල්.සුනීතා මිය<br>දු.අංකය : 071 288 6264 |
| 4. සමාජ යටිතල පහසුකම් අනුකමිටුව | සෑම මාසයකම පළමු පාර්ලිමේන්තු සතියේ අඟහරුවදා දින ප.ව.2.30 | 2021.02.23 ප.ව.2.30<br>අධ්‍යාපන අමාත්‍යාංශය | ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා | එස්.එච්. හරිස්චන්ද්‍ර මහතා (ලේකම්, දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යංශය) | නිහාල් සෝමවීර මහතා<br>දු.අංකය : 077 330 8644<br>ඩබ්.එස්.එස්.ශානිකා ඒකනායක මිය<br>දු.අංකය : 071 3300371 |
| 5. මහජන ආරක්ෂාව හා සමාජ සංවර්ධන අනුකමිටුව | සෑම මාසයකම පළමු පාර්ලිමේන්තු සතියේ සිකුරාදා දින ප.ව.2.30 | 2021.02.25 ප.ව.2.30<br>රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා | ජේ.ජේ.රත්නසිරි මහතා<br>(ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය) | එන්.සී.ෆර්ඩිනැන්ඩු මහතා<br>දු.අංකය : 076 336 1589<br>අයි.ආර්.එම්.කොස්සින්න මිය<br>දු.අංකය : 071 848 2391 |

# ජාතික සම්බන්ධීකරණ අනු කමිටු

## 1. කෘෂිකාර්මික අනු කමිටුව

1. ගරු සී.බී.රත්නායක මැතිතුමා - වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය
   I. ගරු විමලවීර දිසානායක මැතිතුමා - වනජීවී ආරක්ෂණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
2. ගරු චමල් රාජපක්ෂ මැතිතුමා -වාරිමාර්ග අමාත්‍ය
   I. ගරු සිරිපාල ගමලත් මැතිතුමා - මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
   II. ගරු අනුරාධ ජයරත්න මැතිතුමා -ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
3. ගරු මහින්ද අමරවීර මැතිතුමා - පරිසර අමාත්‍ය
4. ගරු එස්.එම්.චන්ද්‍රසේන මැතිතුමා -ඉඩම් අමාත්‍ය
5. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා -කෘෂිකර්ම අමාත්‍ය
   I. ගරු මොහාන් ද සිල්වා මැතිතුමා - පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍ය
   II. ගරු සතාසිවම් වියාලේන්ද්‍රන් මැතිතුමා -පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය
   III. ගරු ඩී.බී. හේරත් මැතිතුමා - පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය
   IV. ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා - වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය
6. ගරු රමේෂ් පතිරණ මැතිතුමා -වැවිලි අමාත්‍ය
   I. ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා -පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය
   II. ගරු කනක හේරත් මැතිතුමා - සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය
   III. ගරු ජානක වක්කුඹුර මැතිතුමා - උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය

## 2. ජීවනෝපාය අනු කමිටුව

1. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා -මුදල් අමාත්‍ය
    I. ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමා -සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
    II. ගරු අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා -මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය

2. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා -කම්කරු අමාත්‍ය
    I. ගරු ප්‍රියංකර ජයරත්න මැතිතුමා -විදේශ රැකියා ප්‍රවර්ධන හා  වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය

3. ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා -අධ්‍යාපන අමාත්‍ය
    I. ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා -කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය
    II. ගරු සීතා අරඹේපොල මැතිතුමිය -නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය

4. ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා -ධීවර අමාත්‍ය
    I. ගරු කංචන විජේසේකර මැතිතුමා -විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය

5. ගරු විමල් වීරවංශ මැතිතුමා -කර්මාන්ත අමාත්‍ය
    I. ගරු දයාසිරි ජයසේකර මැතිතුමා -බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍ය
    II. ගරු ප්‍රසන්න රණවීර මැතිතුමා  -වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය
    III. ගරු ලොහාන් රත්වත්ත මැතිතුමා - මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය

6. ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා -සංචාරක අමාත්‍ය
    I. ගරු ඩී.වී.චානක මැතිතුමා - ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

7. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා -තරුණ හා ක්‍රීඩා අමාත්‍ය
    I. ගරු තේනුක විදානගමගේ මැතිතුමා -ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය

## 3. යටිතල පහසුකම් අනු කමිටුව

1. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා -නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය
    I. ගරු ඉන්දික අනුරුද්ධ මැතිතුමා -ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය
    II. ගරු නාලක ගොඩහේවා මැතිතුමා -නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය
    III. ගරු ජීවන් තොන්ඩමන් මැතිතුමා- වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය
2. ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා -අධ්‍යාපන අමාත්‍ය
    I. ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා -කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය
3. ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා -රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය
    I. ගරු රොෂාන් රණසිංහ මැතිතුමා - පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය
4. ගරු විමල් රාජපක්ෂ මැතිතුමා -වාරිමාර්ග අමාත්‍ය
    I. ගරු සිරිපාල ගමලත් මැතිතුමා -මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
    II. ගරු අනුරාධ ජයරත්න මැතිතුමා -ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
5. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා -විදුලිබල අමාත්‍ය
    I. ගරු දුමින්ද දිසානායක මැතිතුමා -සූර්යබල, සුළං හා ජල විදුලිජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
6. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා -මහාමාර්ග අමාත්‍ය
    I. ගරු නිමල් ලාන්සා මැතිතුමා -ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය
7. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා -ජලසම්පාදන අමාත්‍ය
    I. ගරු සනත් නිශාන්ත මැතිතුමා -ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
9. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා -බලශක්ති අමාත්‍ය
10. ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමා -වරාය හා නාවික අමාත්‍ය
    I. ගරු ජයන්ත සමරවීර මැතිතුමා - ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

## 4. සමාජ යටිතල පහසුකම් අනු කමිටුව

1. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා -කම්කරු අමාත්‍ය

   I. ගරු ප්‍රියංකර ජයරත්න මැතිතුමා -විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍ය

2. ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා -අධ්‍යාපන අමාත්‍ය

   I. ගරු. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා -අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය

   II. ගරු විජිත බේරුගොඩ මැතිතුමා -දහම් පාසල්,පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය

   III. ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා -කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය

   IV. ගරු සීතා අරඹෙපොල මැතිතුමිය -නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය

3. ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මැතිතුමිය -සෞඛ්‍ය අමාත්‍ය

   I. ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමිය - ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය

   II. ගරු සිසිර ජයකොඩි මැතිතුමා -දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය

   III. ගරු චන්න ජයසුමන මැතිතුමා -ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍ය

4. ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා -ප්‍රවාහන අමාත්‍ය

   I. ගරු දිලුම් අමුණුගම මැතිතුම -වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය

5. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා -වෙළඳ අමාත්‍ය

   I. ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා -සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍ය

6. ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා -ජනමාධ්‍ය අමාත්‍ය

7. ගරු විදුර වික්‍රමනායක මැතිතුමා -ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය

## 5. මහජන ආරක්ෂාව හා සමාජ සංවර්ධන අනු කමිටුව

1. ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා -අධ්‍යාපන අමාත්‍ය

   I. ගරු විජිත බේරුගොඩ මැතිතුමා -දහම් පාසල්,පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය

2. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා -විදේශ අමාත්‍ය

3. ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා -රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය

   I. ගරු චමල් රාජපක්ෂ මැතිතුමා - රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය

4. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා -තරුණ හා ක්‍රීඩා අමාත්‍ය

   I. ගරු තේනුක විදානගමගේ මැතිතුමා -ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය

5. ගරු අලි සබ්රි මැතිතුමා -අධිකරණ අමාත්‍ය

   I. ගරු ලොහාන් රත්වත්ත මැතිතුමා -බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍ය

6. ගරු සරත් වීරසේකර මැතිතුමා -මහජන ආරක්ෂක අමාත්‍ය

7. ගරු විදුර වික්‍රමනායක මැතිතුමා - ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය

8. ගරු තාරක බාලසූරිය මැතිතුමා - කලාපීය සහයෝගීතා කටයුතු රාජ්‍ය අමාත්‍ය

# ජාතික සම්බන්ධීකරණ අනු කමිටු වල විෂය පථය

## කෘෂිකාර්මික අනුකමිටුව

### 1. වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

විෂයපථය

වනජීවී හා වන සංරක්ෂණය මගින් ජෛව විවිධත්වය පෝෂණය කිරීම හා පරසර සංවේදි වන වගාවන් තුළින් ජාතික වන වැස්ම පුළුල් කිරීම හා වන සතුන් ජීවත්වන ස්වභාවික පරිසරය සංරක්ෂණය කිරීම

කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "වනජීවී ආරක්ෂණය හා වන සංරක්ෂණය" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වනජීවී හා වන සංරක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

සුවිශේෂී ප්‍රමුඛතා

1. වන ජීවීන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය වනෝද්‍යාන, ජලාශ හා වන සතුන්ගේ ආහාර භෝග වගා පුළුල් කිරීම.

2. වන සතුන්ගෙන් ග්‍රාමීය පළාත්වල නිවාස, දේපළ හා වගාවන් සඳහා වන හානි අවම කර ගැනීමේ නවීන වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම.

3. අලි - මිනිස් ගැටුම් වැලකෙන පරිදි එම අවදානම් ප්‍රදේශවල අලිවැට, අගල් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල්වලට සමගාමීව ප්‍රජා මූල ආරක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.

4. වන වගාව පුළුල් කිරීම මගින් වන ඝනත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා ගෙවතු මට්ටමේ මෙන්ම පාසල්, රෝහල්, කාර්යාල, වැඩපළවල් හා මාර්ග අවම ප්‍රදේශවල මෙන්ම නාගරික උද්‍යානවල වන වගාව හඳුන්වාදීම හා පුළුල් කිරීම.

## 1.1 වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

කාර්යයන් හා කර්තව්‍යයන්

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "වනජීවී ආරක්ෂණය හා වන සංරක්ෂණය" ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

සුවිශේෂී ප්‍රමුඛතා

1. හරිත ආවරණය පුළුල් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2. වගුරු බිම් හා කඩොලාන පද්ධති සංරක්ෂණය කරමින් ඒවා විනාශ කරන මානව ක්‍රියාකාරකම් පාලනය කිරීම.

3. සෝදාපාලු හා නිසරු බිම් හඳුනාගෙන, පොල්, වෙනත් බෝග, තෘණ හා කෘෂි වන වගා උද්‍යාන ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම.

4. කර්මාන්තශාලා ආශ්‍රිතව වන වගා තීරු, නාගරික රුක් ගොමු, අධිවේගී හා මහා මාර්ග ද ඇතුළත්ව මඟදෙපස රුක් රෝපණය, රජයේ කාර්යාල ආශ්‍රිත ඉඩම්, මහල් නිවාස ආශ්‍රිත රුක් වගා, තුරු උයන් හා ගෘහාශ්‍රිත කෘෂි වන වගා දිරිගැන්වීම.

5. කැලෑ නැවත වගා කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

6. ගංගා ආශ්‍රිත හා භූමිය ආශ්‍රිත නිශ්චිත වැලි කැණීම් තීරු ස්ථාපනය කිරීම හා ගංගා නිම්න සංවර්ධනය.

7. හරිත සහ සුහුරු නගර හා වාසස්ථාන සංකල්පය ඇති කිරීම හා ප්‍රචලිත කිරීමත්, පාරිසරික සංවේදී ජනතාවක් බිහිකිරීම සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

8. අලි මිනිස් ගැටුම් වැලැක්වෙන පරිදි ගම් හා ජනාවාස ආරක්ෂාව සඳහා අලිවැට, අගල් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් ග්‍රාමීය ප්‍රජාදායකත්වයෙන් ක්‍රියාත්මක කිරීම.

9. වනජීවින්ගේ රැකවරණය සඳහා ඔවුන්ට වෙන්වූ භූමි ආරක්ෂා කිරීම, එම ප්‍රදේශවල වැව්, ගංගා හා කැලෑ සංවර්ධනය කිරීම හා වන සතුන්ගේ ආහාර ප්‍රවර්ධනය අවශ්‍ය වගාවන් ඇති කිරීම.

## 2. වාරිමාර්ග අමාත්‍යාංශය

විෂයපථය

දිවයින පුරා ඇති වැව් හා වාරිමාර්ග, ජලාශ පද්ධතිය හා ආශ්‍රිත ඇළ වේලි සංරක්ෂණය කරමින් කෘෂිකාර්මික කටයුතු වලට මෙන්ම ජල විදුලි බලාගාර හා පානීය ජලසම්පාදනයට අවශ්‍ය කළමනාකරණය, වාරිමාර්ග පද්ධතිය පුළුල් කිරීම, ජලය කාර්යක්ෂමව පාවිච්චි කිරීමේ නව තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දීම සහ අදාළ කටයුතු.

කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ප්‍රශස්ථ වාරි කළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණපනත් වලට අනුකූලව වාරිමාර්ග විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීම, ජලාපවහන හා ගංවතුර පාලනය කිරීම, ජලාශ හා වාරි පහසුකම් සංවර්ධනය කිරීම සහ කෘෂිකර්මාන්තය, පානීය ජලය, විදුලිය සඳහා අවශ්‍ය ජලය, මනා කළමනාකරණයක් යටතේ සපයාදීම.

විශේෂි ප්‍රමුඛතා

(1) උමා ඔය, බහුවිධ වාරිමාර්ග යෝජනා ක්‍රමය හා ජල විදුලි බලාගාර කඩිනමින් නිම කිරීම.

(2) මොරගහ කන්ද, කළුගඟ ආශ්‍රිත වාරිමාර්ග පද්ධතිය පුළුල් කරමින් උතුරු මැද හා වයඹ පළාත්වල වාරිමාර්ග හා ජලසම්පාදනය පුළුල් කිරීම.

(3) ගිං, නිල්වලා සහ මල්වතු ඔය ඇතුළු ප්‍රධාන ජල යෝජනා ක්‍රම කඩිනම් වැඩසටහනක් තුළ ක්‍රියාත්මක කිරීම.

(4) දේශීය වාරිමාර්ග ඉංජිනේරු සේවාව ආරක්ෂා කරමින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ වෘත්තීය සේවා පුළුල් කිරීම.

## 2.1 මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

කාර්යයන් හා කර්තව්‍යයන්

වාරිමාර්ග අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ප්‍රශස්ථ වාරි කළ නීති සහ අණපනත් වලට අනුකූලව මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන

වැඩපිළිවෙල යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තුමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රත්පත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම හා ඇගයීම.

**සුවිශේෂී ප්‍රමුඛතා**

(1) මහවැලි ගොවි කලාපවල වී, ධාන්‍ය. පළතුරු, එලවළු වගාවන්, මිරිදිය මත්ස්‍ය කටයුතු හා සත්ව නිෂ්පාදන ප්‍රවර්ධන කටයුතු.

(2) මහවැලි කලාප ජනාවාසවල අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහන, වෙළඳපොළ හා ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය.

(3) මහවැලි කලාපවල උපරිම කෘෂි නිෂ්පාදන කටයුතු සඳහා ඉඩම් උපයෝගීකරණය හා ආයෝජන පුළුල් කිරීම

## 2.2 ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

වාරිමාර්ග අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ප්‍රශස්ත වාරි කළ සියළු ජල මූලාශ්‍ර පවිත්‍ර කොට සියළු දෙනාට පානීය හා වාරි ජලය සැපයීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකුලව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

<u>සුවිශේෂී ප්‍රමුඛතා</u>

(1) කුඹුරු ඉඩම් පෝෂ්‍ය ලෙස පිළිවෙළ ආරම්භ කිරීම.

(2) වර්ෂා ජලය ගබඩා කිරීම සඳහා පවතින වැව් හා ජලාශවල ධාරිතාව ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය හා අනෙකුත් වැව් හා ජලාශ විද්‍යාත්මක ප්‍රමිතීන්ට අනුව ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම.

(3) ගංගා දෝණි, ඇල ඉවුරු, වැව් තාවුළු පිරිසිදු කොට වැව් ජලය සංරක්ෂණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කිරීම.

## 3. පරිසර අමාත්‍ය

විෂයපථය

තිරසාර සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය හා ස්වභාවික සෞන්දර්ය රැක ගනිමින් ස්වභාවික සම්පත් පරිහරණය කිරීම මෙන්ම වන, වෘක්ෂලතා, වෙරළ, වගුරු බිම්, ඇළ, දොළ, ගංගා හා වන ජීවීන් ආරක්ෂා කිරීම, කැළිකසළ වළක්වා ගැනීම හා ඉවත් කිරීම, පිරිසිදු නේවාසික පරිසරයක් හා තිරසාර ආර්ථික සංවර්ධනයකට ගැලපෙන පරිදි පරිසර ප්‍රතිපත්ති හා ආයතනවලට අදාළ කටයුතු සිදු කිරීම.

කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "තිරසර පරිසරයක්" ඇති කිරීම සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව පරිසර විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

සුවිශේෂී ප්‍රමුඛතා

1. තිරසර පරිසර සංකල්පය, පාසල් අධ්‍යාපනයේ සිට ප්‍රජාව තුළ ආකල්පමය වශයෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

2. පරිසර ආශ්‍රිත බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය  සමාලෝචනයට ලක් කොට පරිසර හිතකාමී මෙන්ම ජනතා හිතකාමී ලෙස එම ක්‍රියාවලිය මෙහෙයවීම සරල කිරීම.

3. පරිසර හිතකාමී නිෂ්පාදන, බෙදාහැරීම්, ප්‍රවාහන සේවා, යටිතල පහසුකම්, නාගරික සංවර්ධන සහ ආයෝජන හා ආර්ථික කලාප කටයුතු මෙහෙයවීමේදී ව්‍යාපාරික හා සංවර්ධන අවශ්‍යතා තිරසර සංවර්ධන ඉලක්ක සමග තුලනය කිරීම.

4. පරිසර සංරක්ෂණය සඳහා නවීන දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීම.

## 4. ඉඩම් අමාත්‍යාංශය

<u>විෂයපථය</u>

ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් හරහා ප්‍රශස්ත ඉඩම් කළමනාකරණයක් තුළින් සංවර්ධන කාර්යයන්, නේවාසික කටයුතු හා පොදු අවශ්‍යතා සඳහා කඩිනම් වැඩපිළිවෙලක් යටතේ ඉඩම් ලබා දීම හා අනාගත පරපුර සඳහා භූමියේ අයිතිය සුරක්ෂිත කිරීම

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ප්‍රශස්ත ලෙස ඉඩම් කළමනාකරණය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ඉඩම් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

<u>සුවිශේෂී ප්‍රමුඛතා</u>

1. වඩු කර්මාන්තය, වේවැල් කර්මාන්තය, පන් කර්මාන්තය ආශ්‍රිතව පවතින අමුද්‍රව්‍ය ගැටළුවට පිළියමක් ලෙස වගා සමූපකාර ක්‍රමයක් යටතේ ඌන භාවිත රජයේ ඉඩම්වල දිගු කාලීන බදු පදනමක් යටතේ එකී අමුද්‍රව්‍ය වගා කර ගැනීමට අවස්ථාව සහ දිරි ගැන්වීම් ලබා දීම

2. මහවැලි, උමා ඔය, මොරගහකන්ද වැනි විශාල වාරිමාර්ග ව්‍යාපෘති හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින්, නිවාස හා අනෙකුත් දේපළ, ඉඩම් සහ කෘෂිකාර්මික ඉඩම් සඳහා නිසි තක්සේරුවක් සිදු කොට කඩිනමින් වන්දි ලබා දීමට අදාළ ආයතන සමග අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම

3. රජයේ ඉඩම් සහ පොදු ව්‍යාපෘති වශයෙන් අත්පත් කර ගන්නා ඉඩම් කෘෂි වගාවන් සඳහා බදු පදනම යටතේ ලබා දීම සහ ගොවීන්ට වගා කටයුතු කිරීම සඳහා වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම

4. වතු සමාගම්වලට හා රජයේ ගොවිපොලවලට වෙන්කර දැනට භාවිතයට නොගන්නා ඉඩම්වල දේශීය සහ විදේශීය ඉල්ලුමක් ඇති මල් වර්ග සහ කාබනික වගාවන් ඇති කිරීම සහ දේශගුණයට ගැළපෙන අතිරේක භෝග වගාවන් ව්‍යාප්ත කිරීම

5. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක, ස්වාභාවික සම්පත්, නාගරීකරණය සහ අනාගත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ඉඩම් පරිහරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම

6. යාවත්කාලීන ඉඩම් තොරතුරු පද්ධතියක් ඇති කිරීම හා පවත්වාගෙන යාම

7. ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම, ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් කඩිනමින් ලබාදීම සඳහා තොරතුරු තාක්ෂණික ප්‍රවේශයක් සහිත කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කිරීම

8. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය හා ඉඩම් ලබා දීමේ ක්‍රියාවලි සමාලෝචනයට ලක් කොට ඉඩම් අහිමි අඩු ආදායම්ලාභීන් සඳහා ඵලදායී නිෂ්පාදන කටයුතු සඳහා සංවර්ධන හා ආයෝජන ව්‍යාපෘති සඳහා මෙන්ම ඉඩම් කඩිනමින් නිදහස් කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම

9. බිම් සවිය ඉඩම් අයිතිය තහවුරු කිරීමේ වැඩපිළිවෙළ කඩිනම් කිරීම, ඉඩම් විකිණීමෙන් ඉඩම් අහිමි ප්‍රජාවක් බිහිවීම වළක්වාලීම සහ ඉඩම් අයිතිය මත බැංකු, මූල්‍ය හා රක්ෂණ කටයුතු ලබා ගැනීමේ ප්‍රතිපත්තීන් හා නීතිමය රාමුවක් ගොඩ නැගීම

10. අවශේෂ ඉඩම් පරිහරණය පිළිබඳ නිරවුල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම

11. රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් අප්‍රමාදව හා නියමානුකූලව ලබාදීම

12. මහජනතාව වෙත ලබා දී ඇති රජයේ ඉඩම් ආශ්‍රිත ගැටළු විසඳීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම

## 4.1 ඉඩම් කළමණාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

කාර්යයන් හා කර්තව්‍යයන්

ඉඩම් අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ප්‍රශස්ත ලෙස ඉඩම් කළමනාකරණය කිරීම"සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ඉඩම් කළමණාකරණ කටයුතු හා රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

සුවිශේෂී ප්‍රමුඛතා

1. බිම් සවිය වැඩපිළිවෙළ යටතේ රජයේ ඉඩම්ලාභී පුද්ගලයින් ගේ ඉඩම් අයිතිය තහවුරු කිරීම සඳහා නිවැරදි මිණුම් සහිත

දීමනා පත්‍ර නිකුත් කිරීමේ කඩිනම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම

2. තරුණ ව්‍යවසායකත්වය දිරි ගැන්වීමේ ව්‍යාපෘතියක් ලෙස රජයේ ඉඩම් වල ආයෝජන අවස්ථා ලබා දෙමින් ඉඩම් කැබලි ලක්ෂයක් බැංකු සහ අදාළ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කරමින් තරුණයන් වෙත ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

3. භාවිතයට ගත හැකි, එහෙත් භාවිතයට නොගන්නා සහ ඌණ භාවිත ඉඩම්වල ගැටළු හඳුනාගෙන එම ඉඩම් උපරිම ඵලදායීතාවක් සහිතව භාවිතයට ගැනීම සඳහා නීතිමය ක්‍රමවේදයක් සකස් කිරීම

4. සංවර්ධන යෝජනා ක්‍රම සඳහා අත්පත් කරගෙන ඇති මෙතෙක් භාවිතයට නොගත් පෞද්ගලික ඉඩම් සංවර්ධන අවශ්‍යතාවයන් නිසි තක්සේරුවකට ලක් කිරීමෙන් පසුව එම ඉඩම් ඵලදායී ලෙස සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

5. ස්වභාවික ව්‍යසන හෝ රජයේ සංවර්ධන යෝජනා ක්‍රම හේතුවෙන් ඉඩම් අහිමි වූවන් වෙත දැනට පවතින විකල්ප ඉඩම් හා වන්දි ලබා දීමේ කටයුතු කඩිනම් කිරීම

6. රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## 5. කෘෂිකර්ම අමාත්‍යාංශය

විෂයපථය

ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් මත පදනම්ව, නවීන තාක්ෂණ උපයෝගීතාවය තුළ සමෘද්ධිමත් දේශීය කෘෂි සංස්කෘතියක් හා කෘෂි ව්‍යාපාරික ප්‍රජාවක් බිහි කරමින් රටේ දළ ජාතික නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් ලබා දීම හා දේශීය හා ජාත්‍යන්තර පාරිභෝගිකයන් වෙත ප්‍රමාණවත් වස විසෙන් තොර ගුණාත්මක ආහාර හා කෘෂි නිෂ්පාදන සැපයීම, කෘෂිකාර්මික සම්පත් ඉහළ ඵලදායිතාවයකින් යුතුව ප්‍රයෝජනයට ගැනීම තුලින් ආහාර සුරක්ෂිතතාවය, ගොවි ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම, යැපුම් කෘෂිකාර්මික ක්‍රමවේදයන් වෙනුවට වාණිජමය වශයෙන් ඵලදායී නව තාක්ෂණික කෘෂි නිෂ්පාදනයකට පරිවර්තනය වීම හා කෘෂිකාර්මීකරණ ක්‍රියාවලියට (Agro Industrialization) ප්‍රවේශ වීමෙන් සියළු පාර්ශවයන් ඇතුළත්වන ආර්ථික සංවර්ධනයක් ඇති කර ගැනීම.

කාර්යයන් හා කර්තව්‍යයන්

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "නව තාක්ෂණික කෘෂිකර්මාන්තයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම, නියමිත නීති හා අණපනත් වලට අනුකූලව කෘෂිකර්ම විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිලිවෙළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

සුවිශේෂී ප්‍රමුඛතා

1. සම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත කෘෂි අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම සඳහා එක් එක් ඉලක්ක කණ්ඩායම් වලට ගැලපෙන කෘෂි තාක්ෂණික දැනුම පුළුල් කිරීම

2. තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරි ගැන්වීම

3. කෘෂිකර්මාන්තය නගාසිටුවීම සඳහා අදාළ සියළු ආයතන ඒකාබද්ධ කෙරෙන යාන්ත්‍රණයක් සහිත ප්‍රවේශයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම

4. කෘෂිකර්මාන්තයේ දී යොදන රසායනික පලිබෝධ සහ වෙනත් රසායනික සංයෝග නිශ්චිත ප්‍රමිතියක් සහිතව නියාමනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම

5. කෘෂිකාර්මික කටයුතු වලට අවශ්‍ය පරිදි මූල්‍ය සම්පත්, වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම

6. සෘජු නිෂ්පාදකයින්, සැකසුම් ආයතන, තොග වෙළඳ සමාගම සහ අපනයන සමාගම් අතර සැපයුම් සබඳතා ශක්තිමත් කිරීම මගින් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබාදීම

7. නිෂ්පාදන අලෙවිකරණ පහසුකම් සඳහා නව උපායමාර්ගික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම

8. අස්වනු නෙලන අවස්ථාවන්හිදි රජයේ සැලසුම් සහගත මැදිහත් වීම මගින් නිෂ්පාදකයින්ගේ ආදායම පහළ වැටීම නියාමනය කිරීම

9. දේශගුණික වෙනස්කම්, කාලගුණයේ දෛනික තොරතුරු, ගොවි ජනතාවට සන්නිවේදනය කිරීම මගින් ස්වභාවික ආපදාවන් අවම කර ගැනීම

10. ප්‍රමිතියෙන් යුතු බීජ හා පැලෑටි ගොවි ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම

11. ජල කළමනාකරණය හා ගොවීන්ගේ වගා අවශ්‍යතා අනුව ජල සැපයුම කළමනාකරණය කිරීම

## 5.1 පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

කෘෂිකර්ම අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත ''ප්‍රමිතියෙන් යුතු පොහොර භාවිතය දිරි ගැන්වීම'' සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

<u>සුවිශේෂී ප්‍රමුඛතා</u>

1. වී හා ධාන්‍ය වර්ග ගම්මිරිස්, කරබු නැටි, කොකෝවා ඇතුළු ප්‍රධාන භෝග මෙන්ම එළවළු, පළතුරු හා ගෙවතු වගා සඳහා තාක්ෂණික වගා ක්‍රමයන්, උසස් බීජ හා පැළෑටි මෙන්ම නියමිත ප්‍රමිතියෙන් යුත් පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම

2. දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියට අනුගතව කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සහ උසස් මට්ටමේ පොහොර වර්ග ද රට තුළම නිෂ්පාදනය කිරීම දිරි ගැන්වීම

## 5.2 පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

කෘෂිකර්ම අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව තාක්ෂණික කෘෂිකර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන විෂයපථයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

<u>සුවිශේෂී ප්‍රමුඛතා</u>

1. සුවිශේෂිත භූගෝලීය ලක්ෂණයන් සහිත ප්‍රදේශයන්හි වගා කළ හැකි කහ, උඳු, ඉඟුරු, දේශීය අල වර්ග වැනි සුළු භෝග ගෘහ ආශ්‍රිත ඉඩම්වල වගා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

2. ගෘහ ආශ්‍රිතව එළුවන් හා කුකුළන් ඇති කිරීම සඳහා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති සේවාවන් ක්‍රමවත් ලෙස ලබා දීම

3. මූල්‍ය ආයතන, තාක්ෂණික සේවා ආයතන, මූලික උපකරණ හා අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් හඳුනා ගෙන එමගින් සුළු භෝග ආශ්‍රිත ගෘහ නිෂ්පාදන පුළුල් කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීම සම්බන්ධීකරණය

4. අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් උතුරු සහ නැගෙනහිර පළාත්වල පසුගාමී ගම්වල ජීවනෝපාය මාර්ග හා මූලික අවශ්‍යතා සවිබල ගැන්වීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ඇතුළත් පුනර්ජීවන මූල්‍ය සැපයුම් ක්‍රමවේදයක් හඳුන්වා දීම

5. ත්‍රස්තවාදී ක්‍රියාවන්ට ලක් වූ ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග, වාරිමාර්ග, පානීය ජල පහසුකම්, විදුලිය, බෙහෙත් ශාලා හා ප්‍රාථමික පාසැල් සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වැඩසටහන් වලට ප්‍රමුඛත්වය ලබා දීම සඳහා දිළිඳු බව පිටු දැකීම හා ආර්ථික පුනර්ජීවනය සඳහා ක්‍රියාත්මක වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

## 5.3 පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

කෘෂිකර්ම අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව තාක්ෂණික කෘෂිකර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය

සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

<u>සුවිශේෂී ප්‍රමුඛතා</u>

1. විවිධ භූගෝලීය ප්‍රදේශවලට ගැලපෙන පරිදි පශු සම්පත් හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදු කිරීම හා කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපළ සංවර්ධනය දිරි ගැන්වීම

2. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම

3. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හරහා උසස් තත්ත්වයේ තෘණ වර්ග හඳුන්වා දීම

4. මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපලවල් ඉදිකිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම.

5. රජයේ සත්ව ගොවිපොළවල් උපරිම ලෙස භාවිතා කිරීමේ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම

6. කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම සහ අපනයනය කිරීමට දිරිමත් කිරීම

7. කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදන හා පාරිභෝජන අවස්ථා පුළුල් කිරීම

8. සත්ව ගොවිපලවල් සහ නිෂ්පාදන පහසුකම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ඵලදායී අධීක්ෂණ පද්ධති හඳුන්වා දීම

9. පශු වෛද්‍ය පහසුකම් පුළුල් කිරීම මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ගොවීන් සඳහා පහසුකම් සැලසීම

## 5.4 වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

කෘෂිකර්ම අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව තාක්ෂණික කෘෂිකර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, බී ළූණු හා අර්තාපල්, බීජ, පැළෑටි නිෂ්පාදනය හා උසස් තාක්ෂණ කෘෂිකර්ම විෂය පථයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

<u>සුවිශේෂී ප්‍රමුඛතා</u>

1. දේශීය ගොවියා සහ පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයේ සාධාරණ මිළ ප්‍රතිපත්තියක් සහ භෝග විවිධාංගීකරණ වැඩපිළිවෙලක් අදාළ ආයතන සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම

2. කාබනික පොහොර භාවිතය හා වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

3. කාබනික එළවළු හා පලතුරු පරිභෝජනය ගෘහ මට්ටමෙන් පුළුල් කිරීම සඳහා සමෘද්ධි හා අඩු ආදායම්ලාභි ගෙවතු වගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

4. වියළි මිරිස්, බඩ ඉරිඟු, සෝයා, මුං හා කව්පි, එැණු සහ අල වැනි භෝග නිෂ්පාදනය වැඩි කිරීම මගින් එම නිෂ්පාදන ආනයන අවම කිරීම

5. අතිරික්ත නිෂ්පාදනය ගබඩා කිරීම සහ අගය එකතු කිරීමෙන් අපනයනය සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

6. කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා කෘෂි අස්වනු එක්රැස් කිරීමේ සහ සැකසීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම

7. එළවළු, පළතුරු ආශ්‍රිත අපනයන නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

8. ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම

9. ආනයන බීජවල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිළිගත් ප්‍රමිති සහතික තුළ එම ආනයනයන් සිදු කිරීම නියාමනය කිරීම

10. ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම

11. ආවේණික ප්‍රවේණි ගුණයෙන් යුතු සහ ලෙඩ රෝගවලට හා දේශගුණික වෙනස්වීම් වලට ඔරොත්තු දෙන, අධි එලදා බීජ, පැළ වර්ග හඳුන්වා දීම

12. රජයේ ගොවිපොළවල් හා බීජ නිෂ්පාදන ගොවිපොළ සංවර්ධනය

13. නව තාක්ෂණික ක්‍රමවේදයන් තුළ භූ ජලය, බිම් සකස් කිරීම, බීජ හා පැලැටි තෝරා ගැනීම, පොහොර යෙදීම, පෙර හා පසු අස්වනු හා සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමෙන් පූර්ණ අධ්‍යයනයන් සිදු කොට ගොවීන් ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කිරීම

14. තාක්ෂණික කෘෂිකර්මාන්තයක් වෙත යොමු වීම සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණික උපකරණ, ඉඩම් භාවිතය, මූල්‍ය දායකත්වය මගින් වෙළඳපළ වටිනාකම් එකතු කළ කාර්මික නිෂ්පාදන සඳහා යොමු කිරීම

15. අස්වනු නෙළීමේදීත්, ප්‍රවාහනයේදීත්, ගොඩබෑමේදීත් සිදුවන අපතේ යාම වළක්වා ගැනීම සඳහා නව තාක්ෂණ ක්‍රම භාවිතයෙන් රාජ්‍ය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ කර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

16. ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම මගින් වැඩි අස්වනු ලැබෙන ක්‍රමවේදයන් හඳුන්වා දීම මගින් ජල පරිභෝජනයේ ආර්ථික ප්‍රතිලාභ උපරිම කිරීම

## 6. වැවිලි අමාත්‍යාංශය

<u>විෂයපථය</u>

පර්යේෂණාත්මක විධි ක්‍රමයන් නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමිය උපයෝජනය හරහා අගය එකතු කරන ලද නිෂ්පාදන විවිධාංගීකරණයක් තුළින් අපනයන වෙළඳපළ ආකර්ශනය කර ගැනීම ඉලක්ක කර ගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රය නව මානයක් වෙත යොමු කිරීම

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වැවිලි විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

<u>සුවිශේෂී ප්‍රමුඛතා</u>

1. තේ, රබර් සහ පොල් වගා කර ඇති ඉඩම් කැබලි කර ජනාවාස බවට පත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීම හා එම ඉඩම් උපරිම ලෙස වැවිලි හා අතුරු වගා සංවර්ධනය සඳහා යොදා ගැනීම

2. රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සතු ඉඩම් උපරිම ලෙස වගා විවිධාංගිකරණයට ලක් කිරීම හා ආශ්‍රිත කර්මාන්ත දියුණු කිරීම

3. නව තාක්ෂණය හඳුන්වා දෙමින් තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය දායකත්වයක් සැපයිය හැකි ආකාරයට තේ පර්යේෂණ ආයතනය ප්‍රතිසංවිධානය කිරීම

4. මහා පරිමාණ තේ තොග අපනයනය වෙනුවට වටිනාකම් එකතු කළ ආකාරයෙන් තේ අපනයනය දිරිමත් කිරීම

5. රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම සහයෝගීත්වයෙන් Ceylon Tea සඳහා තේ වෙළඳපොල පුළුල් කිරීම

6. දේශීය පිරිසිදු තේ ශ්‍රී ලංකාවේ අනර්ඝතම නිෂ්පාදනයක් ලෙස ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීම

## 6.1 පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

වැවිලි අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

<u>සුවිශේෂී ප්‍රමුඛතා</u>

1. පොල් පර්යේෂණ ආයතනය හා පෞද්ගලික පර්යේෂණාගාර ඒකාබද්ධව අධි ඵලදා පොල් පැල හඳුන්වා දීම සහ දැනට පොල් වගා නොකරන පළාත්වලට ගැලපෙන පොල් පැල ප්‍රභේද හඳුන්වා දීම

2. ගෙවතු පොල් වගා ව්‍යාප්ත කිරීම සඳහා අධි ඵලදා පොල් වර්ග එක් එක් ප්‍රදේශවල භූගෝලීය තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් බෙදා හැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

3. විවිධ පළිබෝධකයන් පාලනය කිරීම සඳහා ජෛව තාක්ෂණික විසඳුම් සංවර්ධනය කිරීම

4. රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා තවාන් සංවර්ධනය කිරීමට කුඩා හා මධ්‍යම පොල් වගාකරුවන් දිරිමත් කිරීම

5. පොල්වතුවල ගම්මිරිස්, ඉඟුරු, කහ, කෝමාරිකා, අන්නාසි වැනි අතුරු භෝග වගාව මෙන්ම සත්ව ගොවිපොළ සඳහා අවශ්‍ය දිරිගැන්වීම් ලබාදීම

6. දේශීය පොල් ඉල්ලුම සපුරාලීමටත් පොල්, තැඹිලි, කුරුම්බා ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන අපනයනය සඳහාත් ක්‍රමෝපායන් සැකසීම

7. පොල් ඵල ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම

8. අගය එකතු කිරීම සහ තාක්ෂණික නවෝත්පාදනයන් පිළිබඳ පර්යේෂණ සිදු කිරීමට පර්යේෂකයන්, විද්‍යාඥයින් සහ නිෂ්පාදකයින් දිරිමත් කිරීම

## 6.2 සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

වැවිලි අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව තාක්ෂණය මුසුවූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්ත ශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

<u>සුවිශේෂී ප්‍රමුඛතා</u>

1. සමාගම් වතු උපරිම ඵලදායිතාවයකින්, තේ හා වෙනත් අපනයන භෝග වගා ප්‍රවර්ධන හා ඉහල වටිනාකම් ඇති අපනයන නිෂ්පාදන බවට පත් කිරීම සහ අවශ්‍ය ජාත්‍යන්තර වෙළඳපළ සකස් කිරීම

2. කාබනික තේ වගාව දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම

3. දේශීය තේවල ගුණාත්මක භාවය ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම

4. වතු අංශයේ ඉඩම් ක්‍රමවත් උපයෝජනය සඳහා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරිම 5. තේ හා රබර් වතු ආශ්‍රිත වෙනත් භෝග වගාවන් හඳුන්වා දිම

6. නවීන තාක්ෂණික ක්‍රමවේදයන් හා යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් තේ හා රබර් කර්මාන්ත ශාලා පූර්ණ නවීකරණයකට ලක් කිරිම හා අවශ්‍ය මූල්‍ය පහසුකම් සඳහා බැංකු ක්‍රමය සම්බන්ධ කිරීම

7. ග්‍රාමීය මට්ටමේ තේ වගාව හා කුඩා තේ වතු හිමියන් දිරිගැන්වීම සඳහා සහන සේවා ක්‍රමවේදයන් බිම් මට්ටමෙන් ක්‍රියාත්මක කිරිම

8. කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වතු හිමියන්ගේ වගාවන් දියුණු කිරීමට අවශ්‍ය දිරි ගැන්වීම් ලබා දීම මගින් රබර් කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම සුලභ කිරීම

9. දේශීය හා විදේශීය වෙළඳපොල ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරිගැන්වීම

## 6.3 උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධනය රාජ්‍ය අමාත්‍යාංශය

<u>කාර්යයන් හා කර්තව්‍යයන්</u>

වැවිලි අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

<u>සුවිශේෂී ප්‍රමුඛතා</u>

1. උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගාකරුවන් සඳහා බැංකු, මූල්‍ය ආයතන කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් වගා දිරිමත් කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම

2. පර්යේෂණ ආයතනයන් හා ඒකාබද්ධව වැඩි අස්වනු සහිත ප්‍රභේද ගොවියන් වෙත හඳුන්වා දීමට ක්‍රියා කිරීම

3. මෙම භෝග ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන දිරිමත් කිරීම සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වා දීම හා අපනයනය පුළුල් කිරීම

4. අක්කර පහට අඩු වතු හිමියන්ගේ භාවිතය සඳහා කුරුඳු නිස්සාරණය හා සැකසුම් කිරීමේ මධ්‍යස්ථානයක් පුළුල් කිරීම හා නව තාක්ෂණ උපකරණ ලබාදීම

5. ත්‍රිපෝෂ හා සත්ත්ව ආහාර සඳහා අවශ්‍ය බඩඉරිඟු රට තුළ නිෂ්පාදනය කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය සහ බැංකු හා මූල්‍ය ආයතන එක්ව ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම

6. වසා දමා ඇති සියලු ම සීනි කර්මාන්තශාලා නොපමාව ආරම්භ කිරීමට කටයුතු කිරීම සහ අවශ්‍යතාව පරිදි නව කර්මාන්ත ශාලා ඉදිකිරීමට අවශ්‍ය දිරි ගැන්වීම් ලබාදීම

7. උක් වගාව සඳහා අවශ්‍ය ජලය කාර්යක්ෂම ව භාවිත කිරීමට අවශ්‍ය වන තාක්ෂණික දැනුම හා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමටත් කටයුතු කිරීම

8. ගෘහාශ්‍රිත භාවිතය සහ අපනයනය සඳහා ගම්මිරිස් වගා කිරීම සඳහා එම භෝග වවන ප්‍රදේශවල අපනයන ගම්මාන පිහිටුවීම

# ජාතික සම්බන්ධීකරණ අනු කමිටු වල විෂය පථය

## ජීවනෝපාය අනුකමිටුව

### 1. මුදල් අමාත්‍යාංශය

❖ විෂයපථය

➢ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, වාර්ෂික අයවැය හා විසර්ජන පනත් සම්බන්ධ වගකීම්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, දේශීය හා විදේශීය ඉතුරු කිරීම් හා ආයෝජන, රාජ්‍ය ණය, බැංකු, මූල්‍ය හා රක්ෂණ කටයුතු ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා, සමාජ ආරක්ෂණ සහ ආර්ථික සංවර්ධන කටයුතු මෙහෙයවීම.

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

➢ ''සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්" ඇති කිරිම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව මුදල් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය හා පෞද්ගලික අංශ යොමු කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

➢ දිළිඳුකම පිටුදැකීම හා ආර්ථික පුනර්ජීවනය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය මගින් සියලු අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් සංවර්ධන කටයුතු මෙහෙයවීම සඳහා පහසුකම් සැලසීම

❖ සුවිශේෂී ප්‍රමුඛතා

➢ සැමට ප්‍රතිලාභ විහිදෙන, සියළු පළාත් ආවරණය වන, ආදායම් විෂමතා අවම වන, තිරසර ඉහළ ආර්ථික වර්ධන වේගයක් ඇති කර ගැනීම

➢ අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛත්වය දෙමින් සේවා වියුක්තිය අඩුකර ගැනීම හා ඒක පුද්ගල ආදායම ඉහළ නංවා ගැනීම

➢ වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුළ මිල ස්ථාවරත්වය ඇති කිරීම

➢ අයවැය හිඟය හා රාජ්‍ය ණය අඩු කර ගැනීම මගින් රාජ්‍ය ආදායම් ප්‍රතිපත්තිවල අවිනිශ්චිතතාවයන් අවම කිරීම

➢ ණය පොලී අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුලින් මූල්‍ය සම්පත් ආර්ථික අවශ්‍යතාවන් පුළුල් කිරීම

➢ රුපියලේ අගය ස්ථාවරත්වය තහවුරු වන පරිදි මූල්‍ය හා ගෙවුම් ශේෂ ප්‍රතිපත්ති හා පොලී අනුපාත ස්ථාවර කර ගැනීම

➢ දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, අඩු ආදායම් ලාභීන් සවිබල ගැන්වීම සහ ආයෝජන දිරිගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දීම

➢ පොදු ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි දේශීය ව්‍යාපාරික ප්‍රජාවට අවශ්‍ය ව්‍යාපාරික පරිසරය පුළුල් කිරීම

➢ රාජ්‍ය ව්‍යවසායන් ශක්තිමත් කිරීම

➢ රජයේ ආදායම් හා වියදම් කළමනාකරණය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම

## 1.1 සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ මුදල් අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ සමෘද්ධිලාභීන් ඉලක්ක කරගත් ගෘහ ආර්ථික සවිබල ගැන්වීම්, ප්‍රජා මූල වැඩසටහන්, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා සේවා පහසුකම් ශක්තිමත් කිරීම හා ස්වයං රැකියා අවස්ථා පුළුල් කිරීම

➢ කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදනය පුළුල් කිරීම

➢ නව ව්‍යවසායකයන් සඳහා අවශ්‍ය දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දෙන ඉඩම්, ණය පහසුකම්, ව්‍යාපාර උපදේශනය, තාක්ෂණික සහ යටිතල පහසුකම් ආදී සියල්ල ම පහසුවෙන් ලබාදෙන විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

➢ සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා එක් ආයතනයක් මගින් සියලු සේවා සැපයීමේ ක්‍රමවේදයක් සකස් කිරීම හා එම ක්ෂේත්‍රවල අගය වැඩිකිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් අවශ්‍ය දිරිගැන්වීම් ලබාදීම

➢ ආබාධිත තැනැත්තන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## 1.2 මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ මුදල් අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම හා ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ ඉතුරුම් හා ආයෝජන දිරි ගැන්වෙන පරිදි බැංකු, මූල්‍ය ආයතන ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම

➢ බිඳවැටී ඇති මූල්‍ය ආයතන ව්‍යාපාර නැවත නගා සිටුවීම සඳහා අවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම

➢ 3කෘෂිකර්මය, ඉදිකිරීම් ක්ෂේත්‍රය,තොරතුරු තාක්ෂණ කර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, සංචාරක සහ අපනයන අංශ දියුණු කිරීම සඳහා ජාතික සංවර්ධන,මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ වැඩසටහන් සම්බන්ධීකරණය හා පුළුල් කිරීම

➢ බැඳුම්කර හා කොටස් වෙළඳපළ ආකර්ශණීය කරවීම

- භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර ප්‍රාථමික වෙළඳපළ ප්‍රතිසංස්කරණ හා නියාමන කටයුතු ශක්තිමත් කිරීම
- අන්තර් ජාතික ව්‍යාපාර ප්‍රමුඛයන් (International Business Giants) ගේ ව්‍යාපාරික ආයතනවල ප්‍රධාන කාර්යාල කොළඹ සහ වරාය නගරය ආශ්‍රිතව ස්ථාපනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම
- විදේශ ආයෝජකයින් මෙරටට ගෙන්වා ගැනීම සඳහා පෞද්ගලික අංශයේද සහය ඇතිව සෞභාග්‍යයේ දැක්ම නව ආර්ථික සැලැස්ම ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර ප්‍රචාරණ වැඩපිළිවෙල දියත් කිරීම
- මහා පරිමාණ දේශීය ආයෝජකයින්ට අධිතාක්ෂණික නිෂ්පාදන (High Technology Products) ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් පුළුල් කිරීම
- දේශීය ව්‍යාපාරිකයන්ට තරඟකාරීව නිසි ලෙස ව්‍යාපාර ක්ෂේත්‍රවලට විදේශ ආයෝජන ප්‍රවේශ නියාමනය හා දේශීය ව්‍යාපාරිකයන් ආරක්ෂා කොට ඔවුන්ව සවිබල ගැන්වීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය ව්‍යාපාර ආර්ථික හා සමාජීය වශයෙන් ජාතික ආර්ථිකයේ කරනු ලබන දායකත්වය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙමින් ඒවායේ මූල්‍ය ශක්තිය වැඩිකිරීම.

## 2. කම්කරු අමාත්‍යාංශය

### ❖ විෂයපථය

- කර්මාන්ත විවිධාංගීකරණයක් හරහා දේශිය, කලාපීය හා ජාත්‍යන්තර සැපයුම් ජාලය හා සම්බන්ධ වෙමින් ගෝලීය
- තරඟකාරීත්වය තුළ සාපේක්ෂ ලාභයන් වෙත ළඟාවීම සඳහා දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය නවීන ක්‍රමෝපායන් හරහා ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය

### ❖ කාර්යයන් හා කර්තව්‍යයන්

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### ❖ සුවිශේෂී ප්‍රමුඛතා

- සියලුම කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු අදාළ ආයතන සමග ඒකාබද්ධව නිරාකරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
- ආනයන අපනයන ක්‍රියාවලිය බාධාවකින් තොරව සහ අවම කාලයක් වැයවන පරිදි කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා "තනි ඒකාබද්ධ යාන්ත්‍රණයක්" ස්ථාපනය කිරීම
- අපනයනය ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සියළු පළාත් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- පවත්නා කර්මාන්තයන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමටත්, ආයෝජන අවස්ථා පුළුල් කරමින් නව කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා ප්‍රවේශයන් ඇති කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
- බිඳවැටී ඇති ව්‍යාපාර හා කර්මාන්තයන් යළි නගා සිටුවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන්

හා ව්‍යාපෘති හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම

- දේශීය ව්‍යවසායකයින් හා ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් සැකසීම
- දැනටමත් ආයෝජන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමග ඒකාබද්ධව එරාවූර් ප්‍රදේශය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඇඟලුම් කර්මාන්ත පුරය ඇරඹීම සඳහා අවශ්‍ය සියළුම යටිතල පහසුකම් ලබා දීම
- දැනට භූගතව සහ සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් නූතන අධිතාක්ෂණය භාවිත කර ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනීම

## 2.1 විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

- කම්කරු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නිපුණ විදේශ රැකියා බලකායක් බිහිකිරීම"සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

- විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා එහි සේවා, විදේශ අමාත්‍යාංශය හා විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති හා කොමසාරිස් කාර්යාල සමග සම්බන්ධීකරණය වන ඒකාබද්ධ පරිපාලන ක්‍රමවේදයක් සකස් කිරීම මගින් විදේශරැකියාවල නිරතවන්නන්ගේ අවශ්‍යතාවන් කාර්යක්ෂමව ඉටුකිරීම.

❖ සුවිශේෂී ප්‍රමුඛතා

- නුපුහුණු ශ්‍රම බලකායක් වෙනුවට විදේශ රැකියා සඳහා පුහුණු ශ්‍රමික වෙළඳපළ අවස්ථාවන් මෙන්ම විදේශ රැකියා වෙළඳපළ විවිධාංගීකරණයකට ප්‍රවේශ වීම.

- විදේශගත ශ්‍රමිකයින් සහ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට තමන් උපයන විදේශ විනිමය ඵලදායී ලෙස ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීම හා ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමය දිරි ගැන්වීම.

- විදේශ රැකියා නිම කර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ ව්‍යාපෘති වැඩපිළිවෙළවල් එම ව්‍යාපාර ක්ෂේත්‍ර සඳහා සම්බන්ධ අමාත්‍යාංශ සමග ක්‍රියාත්මක කිරීම.

- මැදපෙරදිග හා වෙනත් රටවල සේවය කරන ගෘහ සේවිකාවන්ගේ ආරක්ෂාව හා සුභසාධනය සහතික කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

- විදේශ රටවල දී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම.

- පුද්ගලික විදේශ රැකියා නියෝජිතායතන නිසි ක්‍රමවේදයක් යටතේ නියාමනය කිරීම.

## 3. අධ්‍යාපන අමාත්‍යාංශය

❖ **විෂයපථය**

➢ දැනුම පදනම් කරගත් සමාජ ආර්ථිකයක් කරා ශ්‍රී ලාංකීය ජනතාව නගා සිටුවීම සඳහා තිරසර අධ්‍යාපන ක්‍රමෝපායන් මගින් ළමා මිතුරු අධ්‍යාපන,නවෝත්පාදන පදනම් කරගත් දැනුම හා විශිෂ්ඨ උසස් අධ්‍යාපන ක්‍රමයකට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා අනාගත පරපුර වෙත විවෘත කර දීම

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම, නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

➢ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් සැලසුම් කරන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික ව්‍යුහය ස්ථාපිත කිරීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක්ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම

➢ සෑම දරුවෙකුටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහිත ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇතිකිරීම සඳහා ප්‍රතිපත්තිමය රාමුවක් ස්ථාපනය කිරීම

➢ පාසල් ගුරුවරුන් ගේ පරිපාලන ගැටළු ක්ෂණිකව විසඳීම සඳහා දැනට පවතින අදාළ චක්‍රලේඛ විධිවිධාන, රීති, රෙගුලාසි සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම සහ පවතින ආයතනික ව්‍යුහය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අධීක්ෂණ ඒකකයක් හරහා කටයුතු කිරීම

## 3.1 කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා නියමිත නීති සහ අණපනත් වලට අදාළව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- ❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- ➢ කාන්තා සුරක්ෂිතතාවය තහවුරු කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
- ➢ නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩනයට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහනයක් ලබා දීම
- ➢ නිතර ආපදා අවදානමට ලක්වන පුද්ගලයින්ට, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්ට රැකවරණය හා පහසුකම් සැලසීමටත්, දුෂ්කරතා අවම කිරීමටත් ස්ථිර වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම
- ➢ නිරෝගී දරුවකු බිහි කිරීම, මව් සෙනෙහස තුළ දරුවන් රැක බලා ගැනීම හා දරුවන්ට මග පෙන්වීම සඳහා කාන්තාවන්ට අවශ්‍ය දැනුම, කුසලතා හා කාලය ලබා දීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම
- ➢ සියළු දරුවන්ගේ මන්දපෝෂණය නිම කිරීම සඳහා විශේෂ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ➢ අදාළ සියලු ආයතන ඒකාබද්ධව ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමා අයිතිවාසිකම් තහවුරු කිරීමට පියවර ගැනීම
- ➢ සෑම දිස්ත්‍රික් අධිකරණයකම වෙනමම අංශයක් දරුවන් සම්බන්ධව ප්‍රමාද වෙමින් ඇති සියළු නඩු විසදීම සඳහා වෙන් කිරීම
- ➢ ළමා මධ්‍යස්ථානවල සිටින දරුවන් සඳහා කැපකරු පවුල් ක්‍රමයක් ඇති කිරීම සඳහා ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම
- ➢ "ළමා මිතුරු පාසැල" සංකල්පය පුළුල් කිරීම
- ➢ රාජ්‍ය නියාමනය යටතේ ජාතික පෙර පාසැල් ප්‍රතිපත්තිය මත පිහිටා පෙර පාසැල් අධ්‍යාපනය පුළුල් කිරීම
- ➢ ග්‍රාමීය පාසල් සිසු ආකර්ශිත පාසල් බවට පත්කිරීම
- ➢ සියලුම පාසල්වල පන්ති කාමර හා සනීපාරක්ෂක උපකරණ, ගුරු ශිෂ්‍ය විවේකාගාර, සෞඛ්‍ය පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
- ➢ පාසල් පෙළපොත්, විෂයය නිර්දේශ, ගුරු අත්පොත් ආදිය තොරතුරු තාක්ෂණික ක්‍රමවේදයක් ඔස්සේ එළිදැක්වීමට පියවර ගැනීම
- ➢ පොකුරු පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම.

## 3.2 නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

### කාර්යයන් හා කර්තව්‍යයන්

- අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නිපුණතාවයෙන් සපිරි සමාජයක් සහ සුහුරු ජාතියක්" බිහි කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන හා පර්යේෂණ හා නව නිපැයුම් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### සුවිශේෂී ප්‍රමුඛතා

- අධ්‍යාපන සුදුසුකම් නොසළකා තාක්ෂණවේදය සහ උසස් වෘත්තීය අධ්‍යාපනය ලබාදීම සඳහා නව වැඩපිළිවෙළක් ආරම්භ කිරීම
- දැනට පවතින වෘත්තීය පුහුණු ආයතන විධිමත් ඇගයීමකට ලක් කර සුදුසු ආයතන සම්පූර්ණ භෞතික හා විෂයමාලා නවීකරණයක් කොට, "ධබැ ඔඪෑඹ" සංකල්පය යටතේ එම ආයතන ජාලගත කර, තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීම
- රට පුරා විහිදුණු නව "තාක්ෂණික සහ කාර්මික විශ්වවිද්‍යාල විද්‍යායතන" පද්ධතියක් ආරම්භ කිරීම
- ජර්මන් කාර්මික අධ්‍යාපන ආයතනය පුළුල් කිරීම
- දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (හඩු) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී
- ලංකා සුදුසුකම් රාමුව (ිඉ) සංශෝධනය කිරීම
- වෘත්තීය අධ්‍යාපනයේ පශ්චාත් උපාධි මට්ටම් දක්වා අධ්‍යපනය ලැබීමට අවස්ථා සලසා දීම
- වෘත්තීය අධ්‍යාපනය හා ව්‍යවසායකත්වය ඒකාබද්ධ කරමින් තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා දැනුම ඇතුළත් කොට වෘත්තීය අධ්‍යාපනයේ විෂය මාලා සංශෝධනයක් සිදු කිරීම
- විදේශ රැකියා උත්පාදනය හා විවිධාංගිකරණය පිළිබඳ අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් දේශීය හා විදේශීය
- රැකියා වෙළඳපල ඉලක්ක කර ගත් වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක් බිහි කිරීම
- අන්තර්ජාලය ආශ්‍රිතව බිහි වූ උපාංග, කෘතීම බුද්ධිමය, ජෛව තාක්ෂණය, රොබෝ තාක්ෂණය, ඔග්මන්ටඩ් රියලිටි, ක්ලවුඩ් කම්පියුටින්, නැනෝ තාක්ෂණය සහ ත්‍රිමාණ මුද්‍රණය වැනි නවීන තාක්ෂණයන් භාවිතය උපරිම තලයට ගෙන ඒම තුළින් ලංකාව නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම

- බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණවලට සම්බන්ධ දේශීය ආයතනවලට පහසුකම් සැපයීම
- පර්යේෂණ සඳහා දායක වන පෞද්ගලික ව්‍යවසායන් සඳහා බදු සහන ලබා දීම
- නවෝත්පාදන සහිත නිෂ්පාදන දේශීය සන්නාමයක් යටතේ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය දේශීය/ විදේශීය ආයෝජකයින් හඳුන්වා දීම
- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ආයෝජකයින් හා අදාළ භාවිතා කරන්නන් වෙත යොමු වීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම

## 4. ධීවර අමාත්‍යාංශය

### ❖ විෂයපථය

- දේශීය වශයෙන් මත්ස්‍ය පරිභෝජන අවශ්‍යතා සපුරාලමින්, දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගත් ශක්තිමත් ව්‍යාපාරික ප්‍රජාවක් බිහිකරලමින් ධීවර ප්‍රජාවගේ සමාජ හා ජීවන මට්ටම් ඉහළ නංවමින් ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් දක්වන ධීවර කර්මාන්තයක් ඇති කිරීම

### ❖ කාර්යයන් හා කර්තව්‍යයන්

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ධීවර විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### ❖ සුවිශේෂී ප්‍රමුඛතා

- වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දීම
- ධීවර වරාය නවීකරණය කිරීම සහ අවශ්‍යතාවය මත නව ධීවර වරායන් ඉදිකිරීම
- අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම් වලට අවස්ථාව ලබාදීම
- ටින් මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරි ගැන්වීම
- නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය නිෂ්පාදන සඳහා අලෙවි සංවර්ධන කටයුතු පුළුල් කිරීම
- උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණ කිරීම
- ධීවර ප්‍රජාව සඳහා ඵලදායී බැංකු හා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම
- සාගර විශ්ව විද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම

**4.1** **විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය**

❖ **කාර්යයන් සහ කර්තව්‍යයන්**

➢ ධීවර අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක්" ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය, ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර හා මත්ස්‍ය අපනයන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ අපනයන වෙළඳපොල ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ඇති කිරීම සඳහා අවශ්‍යපහසුකම් සැපයීම
➢ වැව්, කලපු හා ගොඩ ඉඩම් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම
➢ මහා පරිමාණ බෝට්ටුවල මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ධීවර වරාය සංවර්ධනය කිරීම
➢ බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම
➢ නවීන සන්නිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියලුම ධීවර වරායන්, නැංගුරම් ස්ථාන වැඩි දියුණු කිරීම
➢ මුහුදු හා මිරිදිය මත්ස්‍යයන් පුළුල් ලෙස බෝ කිරීම සඳහා ධීවර ප්‍රජා සංගම් හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව වැඩසටහනක් ආරම්භ කිරීම
➢ පරිසර හිතකාමී නවීන අධි තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම
➢ ධීවරයින්ගේ සහ එම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ වෘත්තීමය පුහුණුව හා දැනුම දියුණු කිරීම

## 5. කර්මාන්ත අමාත්‍යාංශය

❖ **විෂයපථය**

➢ කර්මාන්ත විවිධාංගීකරණයක් හරහා දේශිය, කලාපීය හා ජාත්‍යන්තර සැපයුම් ජාලය හා සම්බන්ධ වෙමින් ගෝලීය තරඟකාරීත්වය තුළ සාපේක්ෂ ලාභයන් වෙත ළඟාවීම සඳහා දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය නවීන ක්‍රමෝපායන් හරහා ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- ❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

   - ➢ සියලුම කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු අදාළ ආයතන සමග ඒකාබද්ධව නිරාකරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
   - ➢ ආනයන අපනයන ක්‍රියාවලිය බාධාවකින් තොරව සහ අවම කාලයක් වැයවන පරිදි කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා "තනි ඒකාබද්ධ යාන්ත්‍රණයක්" ස්ථාපනය කිරීම
   - ➢ අපනයනය ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සියළු පළාත් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
   - ➢ පවත්නා කර්මාන්තයන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමටත්, ආයෝජන අවස්ථා පුළුල් කරමින් නව කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා ප්‍රවේශයන් ඇති කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
   - ➢ බිඳවැටී ඇති ව්‍යාපාර හා කර්මාන්තයන් යළි නගා සිටුවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම
   - ➢ දේශීය ව්‍යවසායකයින් හා ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් සැකසීම
   - ➢ දැනටමත් ආයෝජන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව එරාවූර් ප්‍රදේශය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඇඟලුම් කර්මාන්ත පුරය ඇරඹීම සඳහා අවශ්‍ය සියළුම යටිතල පහසුකම් ලබා දීම
   - ➢ දැනට භූගතව සහ සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් නූතන අධිතාක්ෂණය භාවිත කර ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනීම

## 5.1 බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇගළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

- ❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

   - ➢ කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇගළුම් නිෂ්පාදන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- ❖ **සුවිශේෂී ප්‍රමුඛතා**
   - ➢ ශ්‍රී ලංකාවේ දේශීය වෙළඳපොල තුළ ඇඟළුම් නිෂ්පාදන හා සැපයුම පුළුල් කිරීම මගින් දේශීය ඇගළුම් සඳහා සංචාරක වෙළඳපළ සංවර්ධනය
   - ➢ බතික් කර්මාන්තය සඳහා අවශ්‍ය ඩයි වර්ග ඇතුළු ඉහළ ගුණත්වයෙන් යුතු අනිකුත් අමුද්‍රව්‍ය අවශ්‍යතා සැපයීම සඳහා වැඩපිළිවෙලක් සැකසීම
   - ➢ දේශීය හා විදේශීය වශයෙන් බතික් හා අත්යන්ත්‍ර කර්මාන්තය ප්‍රචලිත කිරීම සඳහා විශේෂ

වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

- රෙදිපිළි අලෙවි පුරවරයක් ඇති කිරීම සඳහා කටයුතු කිරීම
- රෙදිපිළි නිෂ්පාදන වෙළඳපොල විවෘත හා තරඟකාරී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම
- මහා පරිමාණ දේශීය ආයෝජකයන්ට අධිතාක්ෂණික නිෂ්පාදන අළුතින් ආරම්භ කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

## 5.2 වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යපාරික පරිසරයක් නිර්මාණය කිරීම"සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- වේවැල්, පිත්තල, මැටි, ලී බඩු ඇතුළු ග්‍රාමීය කර්මාන්ත අගය වැඩිකිරීමේ කර්මාන්ත ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් අවශ්‍ය දිරිගැන්වීම් ලබා දීම
- වඩු කර්මාන්තය, වේවැල් කර්මාන්තය, පන් කර්මාන්තය ආශ්‍රිතව පවතින අමුද්‍රව්‍ය ගැටළුවට පිළියමක් ලෙස වගා සමුපකාර ක්‍රමයක් යටතේ ඌන භාවිත රජයේ ඉඩම්වල දිගු කාලීන බදු පදනමක් යටතේ එකී අමුද්‍රව්‍ය වගා කර ගැනීමට අවස්ථාව සහ දිරි ගැන්වීම් ලබා දීම
- දැව සහ ලී බඩු නිෂ්පාදකයන් මුහුණ දී සිටින අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අර්බුදයට විසඳුමක් ලෙස තීරු බදු රහිතව පොතු සහිත දැව කඳන් ආනයනයට අවසර දීම
- වාත්තු සහ ලෝකුරු කර්මාන්ත වැනි සම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිතව ඇති අමුද්‍රව්‍ය සහ වෙළෙඳපොළ ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා සහාය වීම

## 5.3 මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

- කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම"සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව මැණික්, ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ සුවිශේෂී ප්‍රමුඛතා

- පුද්ගලික අංශය සමග තරඟකාරී මට්ටමින් මැණික් ආශ්‍රිත කර්මාන්ත නිර්මාණශීලී ප්‍රවේශයක් හරහා නව්‍යකරණයට ලක් කිරීම
- වටිනාකම එකතු කිරීමෙන් තොරව අපනයනය කරන මැණික් අපනයනය සීමා කොට ඒ ආශ්‍රිත කර්මාන්තයන් සඳහා වටිනාකම එකතු කළ ඉහළ අපනයන ආදායමක් ලබා ගත හැකි අපනයන නිෂ්පාදන බවට පත්කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම
- කපා ඔප දමන මැණික් අපනයනය වෙනුවට නිමකරන ලද ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය නූතන අධිතාක්ෂණික උපකරණ ආනයනය බදුවලින් නිදහස් කිරීම
- මැණික් හා ඛණිජ සම්පත් කර්මාන්ත ආශ්‍රිතව ලබා ගත යුතු පරිසර හා අනෙකුත් අවසර පත්‍ර ක්‍රියාවලිය සමාලෝචනයට ලක් කොට සරල කිරීම හා කර්මාන්තකරුවන් වෙත එම සේවා සැපයීම් පහසුකරලීම

## 6. සංචාරක අමාත්‍යාංශය

❖ විෂයපථය

- ශ්‍රී ලාංකීය සංස්කෘතිය, ජෛව විවිධත්වය, පරිසර හිතකාමීත්වය හා මිත්‍රශීලී ජන අනන්‍යතාවය මතු කරමින් ශ්‍රී ලංකාව සංචාරක ආකර්ශිත රටක් බවට පත්කරමින්, ඉහළ ආදායම් ලබන රැකියා හා ජීවනෝපාය ක්ෂේත්‍රයක් හා උසස් විදේශ විනිමයක් උපයන ආර්ථික ක්ෂේත්‍රයක් ලෙස සංචාරක කර්මාන්තය ශක්තිමත් කිරීම.

❖ කාර්යයන් හා කර්තව්‍යය

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ඉහළ විදේශ විනිමයක් අරමුණු කරගත් පාරිසරික හා දේශීය සංස්කෘතික හිතකාමී සංචාරක කර්මාන්තයක්"ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව සංචාරක විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ සුවිශේෂී ප්‍රමුඛතා

- පුළුල් පුද්ගල සහභාගිත්වයෙන් පාරිසරික හා දේශීය සංස්කෘතික හිතකාමී සංචාරක කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීමට වැඩපිළිවෙලක් සැකසීම
- සංචාරකයින් ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ වැඩපිළිවෙලක් සකස් කිරීම
- විදේශීය සංචාරකයින් සඳහා නව ආකර්ශනීය ස්ථාන හඳුනා ගැනීම
- සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ව්‍යාපාරික සම්මන්ත්‍රණ, උත්සව, ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීමට පහසුකම් සැපයීම
- සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ආයෝජන සහ වෙනත් පහසුකම් සැපයීම
- ප්‍රධාන සංචාරක නගර සම්බන්ධ කරන මාර්ග මංසන්ධිවල සංචාරක සේවා මධ්‍යස්ථාන පිහිටුවීම
- ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම මඟින් සංචාරක පහසුකම් අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම
- ප්‍රධාන සංචාරක නගරවල සංචාරක පුහුණු පාසල් පිහිටුවීම සහ ආකර්ශනීය නිපුණතා සංවර්ධන පාඨමාලා හඳුන්වා දීම
- ගෘහ ආශ්‍රිත හා ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම
- සියලුම සංචාරක මාර්ගෝපදේශකයින් සහ රියදුරන් ලියාපදිංචි කිරීම,පුහුණු කිරීම සහ අනන්‍යතාව සහතික කිරීමට කටයුතු කිරීම
- සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව්‍යවසායකයන් බිහි කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් හඳුන්වා දීම
- තොරතුරු තාක්ෂණය මගින් සංචාරකයින්ට පහසුකම් සැලසීම
- One Stop සංකල්පය යටතේ එක් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් හරහා සිදු කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම
- උසස් තත්ත්වයේ සංචාරක හෝටල් පිහිටු වීමට සහ දැනට පවතින හෝටල් කාමර සංඛ්‍යාව දෙගුණයක් දක්වා වැඩි කිරීම
- ජාතික උරුමයන් සහ පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ නිවැරදි තොරතුරු සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම සඳහා සංචාරක
- මගපෙන්වන්නන් හට නිවැරදි දැනුම සහ තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම

## 6.1 ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- සංචාරක අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ඉහල විදේශ විනිමයක් අරමුණු කරගත් පාරිසරික හා දේශීය සංස්කෘතික හිතකාමී සංචාරක කර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- පවතින නිදහස් වෙළඳ කලාප හා කර්මාන්තපුර උපරිම කාර්යක්ෂමතාවයකින් ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් නැංවීම හා නවීකරණය නොපමාව සිදුකිරීම
- 2කටුනායක ගුවන් තොටුපලේ දෙවන ධාවන පථය සහ මගී පර්යන්තය සංවර්ධනය කිරීම
- කටුනායක ගුවන් තොටුපලේ අභ්‍යන්තර ගුවන් මගී පර්යන්තයක් සංවර්ධනය කිරීම
- නුවරඑළිය ගුවන් තොටුපල ඇතුළු අභ්‍යන්තර ගුවන් තොටුපලවල් සංවර්ධනය කිරීම
- මත්තල ගුවන් තොටුපලේ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම හා පහසුකම් වැඩි දියුණු කිරීම
- ශ්‍රීලන්කන් ගුවන් සේවය ඉහළ ජාත්‍යන්තර ප්‍රමිතිකරණයක් දක්වා උසස් කිරීම සඳහා කටයුතු කිරීම 7. ගුවන් බඩු අපනයනය පුළුල් කිරීම

## 7. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

❖ **විෂයපථය**

- අභිමානවත්, තුලිත පෞරුෂත්වයකින් හෙබි, ජවසම්පන්න තරුණ ප්‍රජාවක් ඇති කිරීම, බාහිර ක්‍රියාකාරකම්වලට යොමු කරමින් සෞඛ්‍ය සම්පන්න ළමා හා තරුණ පිරිසක් බිහිකිරීම, ක්‍රීඩා හිතකාමී ජන සමාජයක්, නාගරික සංවර්ධන, සංචාරක, වාණිජ හා ජාත්‍යන්තර සබඳතා ගොඩනගන ක්‍රීඩා සංස්කෘතියක් ඇති කිරීම.

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "අභිමානවත් ජව සම්පන්න තරුණ පරපුරක් බිහිකිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණපනත්වලට අනුකූලව තරුණ හා ක්‍රීඩා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- රටේ අධ්‍යාපන, සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික පෙරදැක්මට තරුණ සහභාගීත්වයේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කිරීම.
- ආර්ථික ක්ෂේත්‍ර තුළ තරුණ ව්‍යවසායකයන්ට උපරිම අවස්ථා සළසා දීම සඳහා අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් හඳුන්වා දීම සඳහා ක්‍රමෝපායන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය, පෞද්ගලික සහ විදේශීය රැකියා අවස්ථාවන් සඳහා ගැළපෙන, ශ්‍රී ලාංකික තරුණයන් නිවැරදිව හඳුනා ගැනීම පහසු කිරීම සඳහා "තරුණ මානව සම්පත් දත්ත බැංකුවක්" ආරම්භ කිරීම.
- ජාත්‍යන්තර, ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාවන් සඳහා කුසලතා සංවර්ධනය පුළුල් කිරීම.
- ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය හා සංචාරක, නාගරික ක්‍රියාකාරකම්, ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගන ක්‍රීඩා ආර්ථිකයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලාංකීය තරුණ තරුණියන් තුළ විවිධ කුසලතාවයන් පිරි ක්‍රීඩා සහභාගීත්වයක් ඇති කර ජාත්‍යන්තර ක්‍රීඩක පරිසරයක් බිහිකිරීම.
- ක්‍රීඩා සමිති සංවිධාන හා ව්‍යාපාරික ප්‍රජාව ක්‍රීඩා තරගාවලි (events) සඳහා දිරි ගැන්වීම.
- සෞඛ්‍ය සම්පන්නභාවය ඉහළ නැංවීම සඳහා ශාරීරික ව්‍යායාම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ හා දිරි ගැන්වීම් ලබා දීම.

## 7.1 ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ජවසම්පන්න පරපුරක් බිහිකිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- තාරුණ්‍යයේ ජවය සමාජ විරෝධී අංශ වෙත යොමුවීම වළක්වමින් පාසල් අධ්‍යාපනයේ සිට විෂය බාහිර ක්‍රියාකාරකමක් වශයෙන් ද, යෞවන සමාජ, ක්‍රීඩා සමාජ හරහා ද, ක්‍රීඩා කටයුතු තාරුණ්‍ය වෙත හඳුන්වා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම
- අධ්‍යාපනයට අමතරව ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා සඳහා පාසල් දරුවන් ආකර්ශණය කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න ළමා පරපුරක් සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
- දිවයින පුරා විසිරී ඇති ග්‍රාමීය පාසල්වල ක්‍රීඩාවට දක්ෂතා දක්වන දරුවන් කුඩා කාලයේ සිට ම හඳුනාගෙන ඔවුන් ගේ කුසලතාවයන් ජාත්‍යන්තර මට්ටම දක්වා ගෙනඒමට අවශ්‍ය නිසි පෝෂණය සහ පුහුණුව ඇතුළු පහසුකම් සපයන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- ක්‍රීඩා උපදේශකයන්, පුහුණුකරුවන් සහ භෞත චිකිත්සකයින් වැනි ක්‍රීඩාවේ දියුණුවට අවශ්‍ය සම්පත්දායකයන් බිහිකිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
- දිවයින පුරා පිහිටි ක්‍රීඩාගාර හා ක්‍රීඩා භූමි පිළිගත් ප්‍රමිතිකරණයට ලක් කොට ඒවා ඊට ගැළපෙන අයුරින් සංවර්ධනය කිරීම
- දේශීය සම්ප්‍රදායික ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා වැඩපිළිවලක් සකස් කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රීඩා අධ්‍යාපනය පුළුල් කිරීම

# ජාතික සම්බන්ධීකරණ අනු කමිටු වල විෂය පථය

## යටිතල පහසුකම් අනුකමිටුව

## 1. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

❖ **විෂයපථය**

➢ භෞතික අවකාශයේ නව ප්‍රවේශයක් හරහා ආර්ථික කේන්ද්‍රස්ථානයක් වශයෙන් මෙන්ම, සුවපහසු, සුපිරිසිදු නගර ඇති කිරීම සහ ජනතාවට ඇවැසි නේවාසික හා නාගරික පහසුකම් ලබා දීම

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත "නව නගර හා සැමට නිවාස" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව නාගරික සංවර්ධන හා නිවාස විෂයයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ නාගරික සංවර්ධනය කේන්ද්‍රකරගත් බහුවිධ කුසලතා සහිත රැකියා, ව්‍යාපාර හා ආදායම් මාර්ග පුළුල් කිරීම

➢ දේශීය ඉදිකිරීම්කරුවන් සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතාව ලබා දීම

➢ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම

➢ කම්කරු ශ්‍රම ඌනතාවය සඳහා හැකිතාක් තාක්ෂණික විසඳුම් කරා යොමුවීමට අවශ්‍ය දිරි ගැන්වීම් ලබාදීම

➢ පුහුණු කම්කරුවන් බිහිකිරීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ කුසලතා දියුණු කිරීමට වෘත්තීමය අධ්‍යාපනය වෙළෙඳපල අවශ්‍යතාවය අනුව සම්බන්ධීකරණය

➢ ඉදිකිරීම් සඳහා අවශ්‍ය උපදේශන පහසුවෙන් ලබා ගැනීම සඳහා දේශීය වෘත්තීය ඉංජිනේරුවන් සහ උසස් තාක්ෂණවේදීන්ගේ දායකත්වය ලබා ගැනීම හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දේශීය සලකුණ ජාත්‍යන්තර තලයේ සන්නාමයක් බවට පත්කිරීමට හැකිවන පරිදි අවශ්‍ය ඉදිකිරීම් සැලසුම් සකස් කර ගැනීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පී ආයතනය, ඉංජිනේරු ආයතනය, විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතන සමග පහසුවෙන් කටයුතු කිරීමේ සම්බන්ධීකරණ යන්ත්‍රණයක් හඳුන්වා දීම

➢ උප කොන්ත්‍රාත්කරුවන්ට ආරක්ෂාව සැලසෙන නීතී පනත් සම්මත කර දේශීය සුළු සහ මධ්‍ය පරිමාණ උප කොන්ත්‍රාත්කරුවන්ට ආරක්ෂාව සැලසීම

## 1.1 ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සැමට නිවාස හා තිරසර ඉදිකිරීම්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ අවතැන්වූවන්ට ග්‍රාමීය නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

➢ ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේදී අනවශ්‍ය ප්‍රමාදවීම වැලැක්වීම සඳහා එක් ස්ථානයකින් හෝ අන්තර්ජාලය ඔස්සේ සියළු අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ඇති කිරීම

➢ ඉදිකිරීම් කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා දැනට පවතින බලපත්‍ර ලබාදීම ක්‍රමවේදය සරල කිරීම

## 1.2 නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව නගර හා සුපිරිසිදු රටක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා අංග සම්පූර්ණ නිවාස සංකීර්ණ සංවර්ධනය මගින් නාගරික ශ්‍රම බලකාය සමාජීය වශයෙන් සවිබල ගැන්වීම
➢ කොළඹ හා නාගරික තදාසන්න ප්‍රදේශවල මැදි ආදායම්ලාභීන් සඳහා නවීන පහසුකම් සහිත නිවාස සංකීර්ණ සඳහා දිගුකාලීන ණය පහසුකම් සැපයීම සම්බන්ධීකරණය
➢ ගංවතුර පාලනය, නාගරික රථගාල්, සාප්පු සංකීර්ණ, ශරීර සුවතා, විනෝදාශ්වාද පහසුකම් සැපයීම
➢ පැරණි මහල් නිවාස, නව මහල් නිවාස මගින් ප්‍රතිස්ථාපනය කිරීම
➢ නාගරික පැල්පත්වාසීන් සඳහා නාගරික නිවාස යෝජනා ක්‍රම හරහා නවීන නිවාස ලබා දීම හා

ප්‍රජා පහසුකම් ලබාදීම

- මධ්‍යම පාන්තිකයින් ගේ නිවාස ගැටළු විසඳීම සඳහා නව නිවාස ව්‍යාපෘති හා ණය පහසුකම් සැලසීම
- කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම
- නිවාස ඉදිකිරීම් ආයතන සඳහා සහනදායි මිල යටතේ ඉඩම් ලබා දීම මගින් නව නිවාස ව්‍යාපෘති සඳහා අයෝජකයන් දිරිමත් කිරීම
- නාගරික වන උයන්, නාගරික හා අර්ධ නාගරික උද්‍යාන, ජල උද්‍යාන හා මාර්ග දෙපස හරිත මංතීරු හඳුන්වා දීම
- නාගරික අපද්‍රව්‍ය සහ මලාපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ ජලය ප්‍රතිචක්‍රීකරණය සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම
- සමුද්‍ර ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් හඳුන්වාදීම
- සමුද්‍ර ඛාදනය වැළැක්වීමට පියවර ගැනීම

## 1.3 වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

- **කාර්යයන් හා කර්තව්‍යයන්**

- නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "පහසුකම් පිරි ගමක් හා සමෘද්ධිමත් වතු ප්‍රජාවක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- **සුවිශේෂී ප්‍රමුඛතා**

- වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන "ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන" පිහිටුවීම
- වතු ප්‍රජාව ආශ්‍රිතව නිවාස හා මූලික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- වතු ආශ්‍රිත අඩු මහල් ප්‍රමාණයකින් යුත් නිවාස යෝජනා ක්‍රම වතු හිමියන් ගේ ද දායකත්වය සහිතව හඳුන්වා දීම සහ මෙම නිවාස යෝජනා ක්‍රමය තුළ අංග සම්පූර්ණ සෞඛ්‍ය මධ්‍යස්ථාන, පෙර පාසැල් සහ ප්‍රජා ශාලා ඇතුළු පහසුකම්ද ස්ථාපිත කිරීම
- වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

## 2. අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂයපථය**

- දැනුම පදනම් කරගත් සමාජ ආර්ථිකයක් කරා ශ්‍රී ලාංකීය ජනතාව නගා සිටුවීම සඳහා තිරසර අධ්‍යාපන ක්‍රමෝපායන් මගින් ළමා මිතුරු අධ්‍යාපන,නවෝත්පාදන පදනම් කරගත් දැනුම හා විශිෂ්ඨ උසස් අධ්‍යාපන ක්‍රමයකට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා අනාගත පරපුර වෙත විවෘත කර දීම

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම, නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් සැලසුම් කරන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික ව්‍යුහය ස්ථාපිත කිරීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක්ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම
- සෑම දරුවෙකුටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහිත ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇතිකිරීම සඳහා ප්‍රතිපත්තිමය රාමුවක් ස්ථාපනය කිරීම
- පාසල් ගුරුවරුන් ගේ පරිපාලන ගැටළු ක්ෂණිකව විසඳීම සඳහා දැනට පවතින අදාළ චක්‍රලේඛ විධිවිධාන, රීති, රෙගුලාසි සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම සහ පවතින ආයතනික ව්‍යුහය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අධීක්ෂණ ඒකකයක් හරහා කටයුතු කිරීම
- පාසල් අවශ්‍යතාවය සම්බන්ධයෙන් නැවත සමීක්ෂණයක් සිදු කොට ඒ අනුව පාසල් පද්ධතිය ප්‍රතිස්ථානගත කිරීම
- ගුරුවරු අවශ්‍යතාවය පරිදි ස්ථානගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය විසඳුමක් ලබා දීම
- විෂය බාහිර ක්‍රියාකාරකම් පාසල් තුළ ප්‍රචලිත කිරීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සමඟ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ගතවන කාලය අවම කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම
- විශ්වවිද්‍යාල තුළ සහ නේවාසිකාගරයන්හි පහසුකම් ඉහළ නැංවීමට කටයුතු කිරීම

## 2.1 කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පැසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා නියමිත නීති සහ අණපනත් වලට අදාළව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- කාන්තා සුරක්ෂිතතාවය තහවුරු කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
- නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩනයට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහනයක් ලබා දීම
- නිතර ආපදා අවදානමට ලක්වන පුද්ගලයින්ට, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්ට රැකවරණය හා පහසුකම් සැලසීමටත්, දුෂ්කරතා අවම කිරීමටත් ස්ථිර වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම
- නිරෝගී දරුවකු බිහි කිරීම, මව් සෙනෙහස තුළ දරුවන් රැක බලා ගැනීම හා දරුවන්ට මග පෙන්වීම සඳහා කාන්තාවන්ට අවශ්‍ය දැනුම, කුසලතා හා කාලය ලබා දීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම
- සියළු දරුවන්ගේ මන්දපෝෂණය නිම කිරීම සඳහා විශේෂ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අදාළ සියලු ආයතන ඒකාබද්ධව ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමා අයිතිවාසිකම් තහවුරු කිරීමට පියවර ගැනීම
- සෑම දිස්ත්‍රික් අධිකරණයකම වෙනමම අංශයක් දරුවන් සම්බන්ධව ප්‍රමාද වෙමින් ඇති සියළු නඩු විසදීම සඳහා වෙන් කිරීම
- ළමා මධ්‍යස්ථානවල සිටින දරුවන් සඳහා කැපකරු පවුල් ක්‍රමයක් ඇති කිරීම සඳහා ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම
- "ළමා මිතුරු පාසැල" සංකල්පය පුළුල් කිරීම
- රාජ්‍ය නියාමනය යටතේ ජාතික පෙර පාසැල් ප්‍රතිපත්තිය මත පිහිටා පෙර පාසැල් අධ්‍යාපනය පුළුල් කිරීම
- ග්‍රාමීය පාසල් සිසු ආකර්ශිත පාසල් බවට පත්කිරීම
- සියලුම පාසල්වල පන්ති කාමර හා සනීපාරක්ෂක උපකරණ, ගුරු ශිෂ්‍ය විවේකාගාර, සෞඛ්‍ය පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

- පාසල් පෙළපොත්, විෂයය නිර්දේශ, ගුරු අත්පොත් ආදිය තොරතුරු තාක්ෂණික ක්‍රමවේදයක් ඔස්සේ එළිදැක්වීමට පියවර ගැනීම
- පොකුරු පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම

## 3. රාජ්‍ය සේවා, පළාත් හා පළාත් පාලන අමාත්‍ය

❖ **විෂයපථය**

- සියළු රාජ්‍ය සේවාවන්හි පූර්ණ ධාරිතා සංවර්ධනයක් සිදු කරමින් නව තොරතුරු තාක්ෂණික ක්‍රමෝපායන් ඔස්සේ කාර්යයන් ද්විකරණය වළක්වාලමින් සේවා දායකයින් වෙත ප්‍රශස්ථ සේවාවක් ලබා දීම හා පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් පවතින අසමානතා අවම කරමින් ජනතාව වෙත උසස් සේවා සැපයීමක් ලබා දීම

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

- සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ඒකාබද්ධ සේවාවන්හි ආයතනික, පරිපාලන හා පිරිස් කළමනාකරණය
- පාර්ලිමේන්තුව සම්බන්ධ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාලව රජය විසින් ඉටුකළ යුතු කාර්යයන්

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

රාජ්‍ය සේවාව කඩිනම් කිරීම සඳහා දැනට රාජ්‍ය අංශයේ පවත්නා සියළුම චක්‍රලේඛ විධිවිධාන, නීති හා රෙගුලාසි, සමාලෝචනයට ලක් කොට සරල කිරීම

ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය නිලධාරී සංකල්පයේ සිට මහජන සේවා සංකල්පය කරා රාජ්‍ය සේවය ගෙන යාම සඳහා අවශ්‍ය නීතිමය, ප්‍රතිපත්තිමය හා ආයතනික රාමුව සකස් කිරීම

- ස්වාධීන රාජ්‍ය සේවයක් ඇති කිරීම සඳහා අවශ්‍ය නව සේවා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම
- රාජ්‍ය, අර්ධ රාජ්‍ය, සංස්ථා සහ බැංකු සේවයේ සියලුම ආයතනවල සත්භාවයෙන් යුක්තව රාජකාරියේ යෙදෙන රාජ්‍ය නිලධාරීන්ට මුක්තිය හිමි වන පරිදි අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම
- වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්ලාභීන්ට ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප ලබා දීම
- සංස්ථා, අර්ධ රාජ්‍ය, බැංකු සහ පෞද්ගලික අංශය සඳහා සේවක අර්ථසාධක අරමුදලට අමතරව දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම
- සේවා සමාලෝචනයක් සිදු කොට, අවශ්‍ය පරිදි නව සේවා ව්‍යවස්ථා හඳුන්වාදීම හා යාවත්කාලීන කිරීම

- රාජ්‍ය අංශයේ සේවක ආරවුල් විසඳීම සඳහා බේරුම්කාර ක්‍රියාවලියක් හඳුන්වාදීම
- රාජ්‍ය සේවයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වෘත්තීය සංවර්ධනය ද ඇතුළත්ව දීර්ඝ කාලීන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම

## 3.1 පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත් වලට අනුකූලව හා පළාත් සභා හා පළාත් පාලන විෂයයට අදාළ සේවාවන් ප්‍රාදේශීය මට්ටමෙන් ජනතා කේන්ද්‍රීයව ඉටු කිරීමට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ පළාත් සභා හා පළාත් පාලන ආයතන වල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, බල ගැන්වීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- රාජ්‍ය නිලධාරී සංකල්පයේ සිට මහජන සේවා සංකල්පය කරා රාජ්‍ය සේවය ගෙන යාම සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- මහජන හිතෛෂී සේවාවක් උදෙසා රාජ්‍ය සේවය තුළ තොරතුරු තාක්ෂණ මෙවලම් උපයෝජනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ තාක්ෂණික ධාරිතාවය පුළුල් කිරීම
- රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ සේවා ද්වීකරණය වැළැක්වීම සඳහා එවැනි අවස්ථා අධ්‍යයනය කොට එම තත්ත්වය වළක්වාලීම සඳහා විශේෂ ක්‍රමවේදයක් හඳුන්වා දීම
- පළාත් පාලන හා පළාත් සභා බල ප්‍රදේශවල ග්‍රාමීය හා දුෂ්කර ගම්වලට මුල්තැන දෙමින් ප්‍රාථමික පාසැල්, රෝහල්, මාතෘ නිවාස, වැඩිහිටි හා ළමා නිවාස සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමේ විශේෂ ව්‍යාපෘති අදාළ ආයතන සමඟ සැලසුම් කර ක්‍රියාත්මක කිරීම
- පළාත් සභා හා පළාත් පාලන කෘෂි මාර්ග, ග්‍රාමීය මාර්ග, හා පළාත් මාර්ග ලක්ෂයේ වැඩසටහන හා ජාතික මට්ටමේ මාර්ග පද්ධතියට සම්බන්ධ කෙරෙන අයුරින් සංවර්ධන කිරීම සඳහා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරීන් සමඟ සැලසුම් කර ක්‍රියාත්මක කිරීම

## 4. වාරි මාර්ග අමාත්‍යාංශය

❖ විෂයපථය

➢ දිවයින පුරා ඇති වැව් හා වාරිමාර්ග, ජලාශ පද්ධතිය හා ආශ්‍රිත ඇළ වේලි සංරක්ෂණය කරමින් කෘෂිකාර්මික කටයුතු වලට මෙන්ම ජල විදුලි බලාගාර හා පානීය ජලසම්පාදනයට අවශ්‍ය ජලය කළමනාකරණය, වාරිමාර්ග පද්ධතිය පුළුල් කිරීම. ජලය කාර්යක්ෂමව පාවිච්චි කිරීමේ නව තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දීම සහ හා අදාළ කටයුතු

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ප්‍රශස්ත වාරි කළමනාකරණයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණපනත් වලට අනුකූලව වාරිමාර්ග විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් සහ ඒ්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදන කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

➢ ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීම, ජලාපවහන හා ගංවතුර පාලනය කිරීම, ජලාශ හා වාරි පහසුකම් සංවර්ධනය කිරීම සහ කෘෂිකර්මාන්තය, පානීය ජලය, විදුලිය සඳහා අවශ්‍ය ජලය, මනා කළමනාකරණයක් යටතේ සපයා දීම

❖ සුවිශේෂී ප්‍රමුඛතා

➢ උමා ඔය, බහුවිධ වාරිමාර්ග යෝජනා ක්‍රමය හා ජල විදුලි බලාගාර කඩිනමින් නිම කිරීම.

➢ මාරගහ කන්ද, කළුගඟ ආශ්‍රිත වාරිමාර්ග පද්ධතිය පුළුල් කරමින් උතුරු මැද හා වයඹ පළාත්වල වාරිමාර්ග හා ජලසම්පාදනය පුළුල් කිරීම

➢ ගිං, නිල්වලා සහ මල්වතු මය ඇතුළු ප්‍රධාන ජල යෝජනා ක්‍රම කඩිනම් වැඩසටහනක් තුළ ක්‍රියාත්මක කිරීම

➢ දේශීය වාරිමාර්ග ඉංජිනේරු සේවාව ආරක්ෂා කරමින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ වෘත්තීය සේවා පුළුල් කිරීම

## 4.1 මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

➢ වාරිමාර්ග අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ප්‍රශස්ත වාරි කළමනාකරණයක්"ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත් වලට අනුකූලව මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඒ්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- ❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ මහවැලි ගොවි කලාප වල වී, ධාන්‍ය. පළතුරු, එළවළු වගාවන්, මිරිදිය මත්ස්‍ය කටයුතු හා සත්ව නිෂ්පාදන ප්‍රවර්ධන කටයුතු 2. මහවැලි කලාප ජනාවාස වල අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහන, වෙළඳපොළ හා ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය

## 4.2 ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

- ❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ වාරිමාර්ග අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ප්‍රශස්ත වාරි කළමනාකරණයක්" තුළ සියලු ජල මුලාශ්‍ර පවිත්‍ර කොට සියලු දෙනාට පානීය හා වාරි ජලය සැපයීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- ❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ කුඹුරු ඉඩම් පෝෂ්‍ය ලෙස පිළිසකර කිරීම හා කුඹුරු අස්වැද්දීමට අවශ්‍ය කුඩා වැව් ප්‍රජා පාදක වැඩසටහන් මගින් ප්‍රතිසංස්කරණය කිරීම
➢ වර්ෂා ජලය ගබඩා කිරීම සඳහා පවතින වැව් හා ජලාශවල ධාරිතාව ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය හා අනෙකුත් වැව් හා ජලාශ විද්‍යාත්මක ප්‍රමිතීන්ට අනුව ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම
➢ ගංගා ද්‍රෝණි, ඇල ඉවුරු, වැව් තාවුළු පිරිසිදු කොට වැව් ජලය සංරක්ෂණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කිරීම
➢ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ජල සම්පත් මණ්ඩලය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය වෙමින් එම ආයතනයන්හි අදාළ අංශ සමග ඒකාබද්ධ ක්‍රමවේදයක් යටතේ කටයුතු කිරීම

## 5. විදුලිබල අමාත්‍යාංශය

- ❖ **විෂය පථය**

➢ දිගුකාලීන විදුලි ජනන සැලැස්ම උපයෝගී කර ගනිමින්, සියලුම නාගරික හා ග්‍රාමීය ප්‍රජාවගේ අවශ්‍යතාවයන් සඳහා විදුලි බල අවශ්‍යතා සපුරාලීම හා ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවල වෙළඳපළ තරගකාරීත්වය තහවුරු වන ලෙස විදුලි බලය සැපයීම හා බලශක්ති සුරක්ෂිතතාවය ස්ථාපිත කිරීම.

- ❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "අඩු වියදම් විදුලි ජනන සම්මිශ්‍රණයක් හා කාර්යක්ෂම බෙදාහැරීමක් සහතික කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව විදුලිබල විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ, ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ ජනනය කරන ලද විදුලිබලයේ කාර්යක්ෂමතාව සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා සුහුරුජාලයක් සංවර්ධනය කිරීම.
➢ ලක් විජය ගල් අඟුරු විදුලි ජනන ව්‍යාපෘති ධාරිතාව සඳහා ආයෝජන පුළුල් කිරීම.
➢ පුනර්ජනනීය බලශක්ති, තාප බලාගාර, ස්වභාවික බලාගාර සම්මිශ්‍රණ තුළනය කරමින් විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම හා ජනනයේ දී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම.
➢ දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
➢ විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.
➢ කාර්මික නිෂ්පාදන ක්‍රියාවලියේ ජාත්‍යන්තර තරගකාරිත්වය පවත්නා පරිදි විදුලිබල පිරිවැය අවම කිරීම.

## 5.1 සූරියබල, සුළං හා ජල විදුලිජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ විදුලිබල අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "අඩු වියදම් බලශක්තිය ලබාගැනීම සහතික කිරීම"සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ කැලණිතිස්ස බලාගාරය ස්වභාවික වායු ටර්බයින ආශ්‍රිත බලාගාරයක් බවට පත් කිරීම සහ කෙරවලපිටිය බලාගාරය පුළුල් කිරීම.
➢ ජනනය කරන ලද විදුලිබලයේ කාර්යක්ෂමතාව සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් සංවර්ධනය කිරීම.
➢ නිවාස, කාර්යාල හා කර්මාන්තශාලා සඳහා අඩු වියදම් විදුලිබල ලබා ගැනීම සහතික කිරීමට සූර්ය බල පද්ධති භාවිතය දිරිමත් කිරීම.
➢ කොළඹ ප්‍රදේශයේ ඇති සියලුම ඉන්ධන බලාගාර ස්වාභාවික වායු ටර්බයින බලාගාර බවට පරිවර්තනය කිරීම.
➢ ගෘහ කුටුම්භ හා කුඩා ව්‍යාපාර සඳහා අඩු වියදම් බලශක්තිය ලබා ගැනීම සහතික කිරීම සඳහා වහල මත සවි කරන ලද සූර්යකෝෂ පද්ධති භාවිතය දිරිමත් කිරීම.
➢ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික අංශය හා ව්‍යවසායකයන් දිරිමත් කිරීම.
➢ 2020 වන විට බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරය, 2021 වන විට උමා ඔය, 2023 වන විට මොරගොල්ල හා 2024 වන විට තලපිටිගල සහ සීතාවක ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීම.
➢ 2021 වන විට මන්නාරම සුළං බලාගාරය මගින් බලශක්තිය මෙගාවොට් 100 ක් සහ මන්නාරම, පූනරීන් සහ මොණරාගල ප්‍රදේශවල සුළං හා සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් මෙගාවොට් 800 ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම

## 6. මහාමාර්ග අමාත්‍යාංශය

**විෂයපථය**

මහජනතාවට යාම් ඒම් සඳහා අවශ්‍ය මාර්ග පහසුකම් සැපයීම හා ශ්‍රී ලංකාව සංවර්ධිත ආර්ථිකයක් කරා රැගෙන යාමට අවශ්‍ය සහසම්බන්ධිත මාර්ග පද්ධතියක් ස්ථාපනය කිරීම.

**කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "සහසම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම හා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව මහාමාර්ග විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**සුවිශේෂී ප්‍රමුඛතා**

- අදාළ ආර්ථික, ආයෝජන කලාප හා ග්‍රාමීය හා නාගරික මාර්ග සම්බන්ධ කරමින් සංවර්ධනය නොකළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා මාර්ග පද්ධතිය නඩත්තු කිරීම.
- කොළඹ මහනුවර වරාය පිවිසුම් උස් අධිවේගී මාර්ගය, උතුරු අධිවේගී මාර්ගය, රුවන්පුර අධිවේගී මාර්ගය, නව කැලණි පාලම සිට අතුරුගිරිය අධිවේගී මාර්ගය සම්පූර්ණ කිරීම.
- කාර්යක්ෂම මාර්ග සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අවශ්‍ය යටිතල පහසුකම්, වාහන තදබදය අවම කිරීම සඳහා පද්ධතියක් නිර්මාණය කිරීම හා සෑම ප්‍රධාන නගරයක ම යාන්ත්‍රික සිරස් වාහන අංගන පිහිටුවීම.

## 6.1 ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- මහාමාර්ග අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සහසම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක්" ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය හා නවීකරණය කිරීම.
- ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග සඳහා ඉහළ මට්ටමේ ප්‍රවේශයක් සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සකස් කිරීම. 3. මාර්ග ජාලය හා බැඳුණු පාලම් පද්ධතිය නවීකරණය කිරීම.

## 7. ජලසම්පාදන අමාත්‍යාංශය

❖ **විෂය පථය**

- දිවයිනේ සියලු නිවෙස් ආවරණය වන පරිදි ජල සම්පාදනය කිරීමත්, පවත්නා ජල සම්පාදන හා ජල ප්‍රවාහන පද්ධති ඉහළ ප්‍රමිතියකින් පවත්වා ගැනීම, නඩත්තු කිරීම හා ධාරිතාව පුළුල් කිරීමත්, මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමටත්, පෞද්ගලික හා රාජ්‍ය ආයෝජන දිරි ගන්වමින් ප්‍රමිතියෙන් යුත් පානීය ජල සම්පාදනය හා බෙදා හැරීම.

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්ති මත පිහිටා "සැමට ජලය" ලබා දීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ජල සම්පාදන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- සැමට ජලය ලබා දීම සඳහා නව ජල සම්පාදන හා ජල ප්‍රවාහන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකර්ම අමාත්‍යාංශය හා වාරිමාර්ග අමාත්‍යාංශය විෂයපථයන් යටතේ ඇති පිළිවෙළින් ග්‍රාමීය වැව්, ජලාශ හා වාරිමාර්ග පද්ධතීන් සම්බන්ධීකරණය කරමින් භූගත ජල සුරක්ෂිතතාවය හා ග්‍රාමීය හා නාගරික ජල යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම
- පානීය ජල නල පද්ධතියේ හා බෙදා හැරීමේ දී සිදු කරන නාස්තිය හා ජලය අපතේ යෑම වළක්වා ගැනීම.

## 7.1 ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- ජල සම්පාදන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සැමට ජලය"ලබා දීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- ප්‍රජා ජල සම්පාදන හා ව්‍යාපෘති කාර්යක්ෂමව හා විධිමත්ව ඉටු කිරීම සඳහා පියවර ගැනීම.
- ග්‍රාමීය ජනතාවට ප්‍රමිතියෙන් යුතු පානීය ජල සැපයීම සඳහා ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති නඩත්තු කිරීම හා දියුණු කිරීම.
- ග්‍රාමීය පළාත්වල පානීය ජල සැපයුම ස්ථාවර කර ගැනීම ජලාශ, ජල පෝෂිත මාර්ග සංවර්ධනය හා ජල සංරක්ෂණ කටයුතු.
- ජාතික වාරිමාර්ග පද්ධතිය මගින් ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ජලසම්පාදන ව්‍යාපෘති ආශ්‍රිතව ජලය බෙදාහැරීමේ ව්‍යාපෘති කඩිනම් කිරීම.

## 8. බලශක්ති අමාත්‍යාංශය

❖ විෂය පථය

බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම හා ඉන්ධන ආනයනය අඩු කර ගැනීම සඳහා ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි ඛණිජ තෙල් හා ගෑස් ඇතුළු අතුරු නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම, ගබඩා පහසුකම් පුළුල් කිරීම හා බෙදාහැරීම් කටයුතු හා අදාළ ප්‍රමිතීන්වල නියාමන කටයුතු හා අදාළ රාජ්‍ය ව්‍යාපාර කාර්යක්ෂම ලෙස පවත්වා ගැනීම.

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "අඩු වියදම් බලශක්තිය ලබා ගැනීම සහතික කිරීම" සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව බලශක්ති විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ, ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ සුවිශේෂී ප්‍රමුඛතා

➢ ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාවය සහ ස්වයංපෝෂිතභාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්තිමය හා උපායමාර්ගික රාමුව සකස් කිරීම.
➢ ස්වාභාවික වායුව ගවේෂණය කිරීම කඩිනම් කිරීම.
➢ තෙල් පිරිපහදු ධාරිතාවය පුළුල් කරමින් නවීකරණය කිරීම.
➢ ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ගබඩා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම.
➢ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික අංශය හා ව්‍යවසායකයින් දිරිමත් කිරීම.
➢ කාර්මික අපද්‍රව්‍ය උපයෝගීකර ගනිමින් කාර්යක්ෂම බලශක්ති උත්පාදනය දිරිමත් කිරීම.
➢ නව ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කිරීමෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බලශක්ති භාවිතය උපරිම කිරීම.

## 9. වරාය හා නාවික අමාත්‍යාංශය

❖ විෂය පථය

➢ ශ්‍රී ලංකාව ඉන්දියානු සාගර ජාලයත්, වාණිජ සහ මුදල් කේන්ද්‍රස්ථානයක්, ජාත්‍යන්තර කාර්මික හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් ලෙසත් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය වරාය හා නාවුක සැපයුම් පද්ධතිය ප්‍රතිෂ්ඨාපනය කිරීම.

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "තරගකාරී ලෙස ආනයන අපනයන පහසුකම් සැපයීමට වරාය සංවර්ධනය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මග පෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වරාය හා නාවික විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා

ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ කොළඹ සහ හම්බන්තොට මුහුදු වරායන් වාණිජ හා මගී වරායන් ලෙස සංවර්ධනය කිරීම හා ආයෝජන පුළුල් කිරීම.

➢ හම්බන්තොට වරාය කාර්මික හා සේවා වරායක් ලෙස සංවර්ධනය කිරීම සහ නැව් නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම සහ නැව් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම වැනි සේවාවන් සැපයීම සඳහා දේශීය ව්‍යාපාර සඳහා පහසුකම් ඇති කිරීම.

## 9.1 ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ වරාය හා නාවික අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "තරගකාරී ලෙස ආනයන අපනයන පහසුකම් සැපයීමට වරාය සංවර්ධනය කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ගුදම් පහසුකම්, බහාලුම් අංගන වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් පෑලියගොඩ, වේයන්ගොඩ සහ රත්මලාන යන ප්‍රදේශවල මාර්ග හා දුම්රිය සහසම්බන්ධතාව පදනම් කරගත් බහාලුම් අංගන සංවර්ධනය කිරීම.

➢ ප්‍රතිනැව්ගත කිරීම් හැසිරවීමේ ධාරිතාවය, ගුදම් පහසුකම් බහාලුම් අංගන, සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන වැඩි දියුණු කිරීම.

➢ කලාපීය අවශ්‍යතාවයන් සහ ජාතික ආර්ථිකයේ අවශ්‍යතා අනුව ගාල්ල, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමලය වරායන් සංවර්ධනය කිරීම.

➢ ජාතික කර්මාන්තයක් වශයෙන් ධීවර, නාවික හා සංචාරක ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය බෝට්ටු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.

➢ විදේශ වෙළෙඳපළ අවශ්‍යතා ඉලක්ක කර ගනිමින් අපනයනය සඳහා නැව් හා බෝට්ටු නඩත්තු, අළුත්වැඩියා හා නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම හා දිරි ගැන්වීම.

➢ නැව් හා බෝට්ටු නිෂ්පාදන සඳහා අවශ්‍ය ඉංජිනේරු හා තාක්ෂණික පහසුකම්, එම නිෂ්පාදන සඳහා අවශ්‍ය තටාංගන හා යටිතල පහසුකම් සංවර්ධනය.

➢ ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ශ්‍රී ලංකා රේගුව සමග සම්බන්ධීකරණය.

# ජාතික සම්බන්ධීකරණ අනු කමිටු වල විෂය පථය

## සමාජ යටිතල පහසුකම් කමිටුව

## 1. කම්කරු අමාත්‍යාංශය

❖ විෂය පථය

➢ කම්කරු නීති ප්‍රඥප්ති ප්‍රමිති සම්බන්ධයෙන් ජාත්‍යන්තරය සමග සබඳතා පවත්වා ගනිමින්, කම්කරු ප්‍රජා ආරක්ෂණය, සුබසාධනය සිදු කිරීම හා කාර්මික සාමය හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම.

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "පෞද්ගලික අංශයේ සේවක ආරක්ෂාව ඇති කිරීම සහ නිපුණ විදේශ රැකියා බලකායක් බිහිකිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව කම්කරු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති, සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ සුවිශේෂී ප්‍රමුඛතා

➢ කම්කරු විෂය පථයට ගැනෙන සියලු චක්‍රලේඛ, නීති, අණපනත්, රීති, රෙගුලාසි සමාලෝචනය කොට වර්තමානයට ගැලපෙන සහ සේවක අයිතීන් සුරක්ෂිත කෙරෙන පරිදි අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම.

➢ සේවක අර්ථසාධක අරමුදලට අමතරව සේවකයින්ගේ සැඳෑසමය සුරක්ෂිත කරන දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම.

➢ කම්කරුවන්ගේ නිපුණතා හා කුසලතා දියුණු කරමින්, සේවා ස්ථානවල ඉහළ ප්‍රමිතීන් සහිත සනීපාරක්ෂක හා සේවක ආරක්ෂණ ක්‍රම පවත්වා ගනිමින් සේව්‍ය සේවක සුහදතාවය පදනම්ව ඵලදායී වැඩසටහන් දිරි ගැන්වීම.

## 1.1 විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

කම්කරු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නිපුණ විදේශ රැකියා බලකායක් බිහිකිරීම"සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා එහි සේවා, විදේශ අමාත්‍යාංශය හා විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති හා කොමසාරිස් කාර්යාල සමඟ සම්බන්ධීකරණය වන ඒකාබද්ධ පරිපාලන ක්‍රමවේදයක් සකස් කිරීම මගින් විදේශ
රැකියාවල නිරතවන්නන්ගේ අවශ්‍යතාවන් කාර්යක්ෂමව ඉටුකිරීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- නුපුහුණු ශ්‍රම බලකායක් වෙනුවට විදේශ රැකියා සඳහා පුහුණු ශ්‍රමික වෙළඳපළ අවස්ථාවන් මෙන්ම විදේශ රැකියා වෙළඳපළ විවිධාංගීකරණයකට ප්‍රවේශ වීම.
- විදේශගත ශ්‍රමිකයින් සහ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට තමන් උපයන විදේශ විනිමය ඵලදායී ලෙස ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීම හා ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමය දිරි ගැන්වීම.
- විදේශ රැකියා නිම කර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ ව්‍යාපෘති වැඩපිළිවෙළවල් එම ව්‍යාපාර ක්ෂේත්‍ර සඳහා සම්බන්ධ අමාත්‍යාංශ සමග ක්‍රියාත්මක කිරීම.
- මැදපෙරදිග හා වෙනත් රටවල සේවය කරන ගෘහ සේවිකාවන්ගේ ආරක්ෂාව හා සුභසාධනය සහතික කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
- විදේශ රටවල දී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම.
- පුද්ගලික විදේශ රැකියා නියෝජිතායතන නිසි ක්‍රමවේදයක් යටතේ නියාමනය කිරීම.

## 2. අධ්‍යාපන අමාත්‍යාංශය

❖ **විෂයපථය**

- දැනුම පදනම් කරගත් සමාජ ආර්ථිකයක් කරා ශ්‍රී ලාංකීය ජනතාව නගා සිටුවීම සඳහා තිරසර අධ්‍යාපන ක්‍රමෝපායන් මගින් ළමා මිතුරු අධ්‍යාපන,නවෝත්පාදන පදනම් කරගත් දැනුම හා විශිෂ්ඨ උසස් අධ්‍යාපන ක්‍රමයකට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා අනාගත පරපුර වෙත විවෘත කර දීම

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම, නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් සැලසුම් කරන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික ව්‍යුහය ස්ථාපිත කිරීම

❖ **සුවිශේෂි ප්‍රමුඛතා**

- පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක්ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම

- සෑම දරුවෙකුටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහිත ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇතිකිරීම සඳහා ප්‍රතිපත්තිමය රාමුවක් ස්ථාපනය කිරීම

- පාසල් ගුරුවරුන් ගේ පරිපාලන ගැටළු ක්ෂණිකව විසඳීම සඳහා දැනට පවතින අදාළ චක්‍රලේඛ

විධිවිධාන, රීති, රෙගුලාසි සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම සහ පවතින ආයතනික ව්‍යුහය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අධීක්ෂණ ඒකකයක් හරහා කටයුතු කිරීම

- පාසල් අවශ්‍යතාවය සම්බන්ධයෙන් නැවත සමීක්ෂණයක් සිදු කොට ඒ අනුව පාසල් පද්ධතිය ප්‍රතිස්ථානගත කිරීම
- ගුරුවරු අවශ්‍යතාවය පරිදි ස්ථානගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය විසඳුමක් ලබා දීම
- විෂය බාහිර ක්‍රියාකාරකම් පාසල් තුළ ප්‍රචලිත කිරීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සමඟ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ගතවන කාලය අවම කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම
- විශ්වවිද්‍යාල තුළ සහ නේවාසිකාගරයන්හි පහසුකම් ඉහළ නැංවීමට කටයුතු කිරීම
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපල ඉලක්ක කර ගනිමින් උපාධිධාරීන් බිහි කිරීම සඳහා සමස්ථ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂයමාලා සංශෝධනය කිරීම
- විශ්වවිද්‍යාල සඳහා තොරතුරු තාක්ෂණ පහසුකම් ලබා දීම
- මහපොළ හා ශිෂ්‍යාධාර සඳහා විධිමත් ක්‍රමවේදයක් යටතේ තෝරා ගැනීම හා එහි පහසුකම් පුළුල් කිරීම
- සාගර විශ්වවිද්‍යාලය හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම
- සියළුම රාජ්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයකට පත්කිරීම සඳහා පියවර ගැනීම
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා පහසුකම් ඇති කිරීම
- නවක වද සංස්කෘතිය සියළු විශ්වවිද්‍යාලවලින් හා උසස් අධ්‍යාපන ආයතනවලින් තුරන් කිරීමට කටයුතු කිරීම
- සුහුරු අධ්‍යාපන විශ්වවිද්‍යාල ඇති කිරීම සඳහා පියවර ගැනීම

## 2.1 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

### ❖ කාර්යයන් හා කර්තව්‍යයන්

- අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දැනුමෙන් පිරිපුන් සමාජයක්" ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් විෂයානුබද්ධ ජනාධිපති කාර්ය සාධක බලකාය හා විශේෂ කමිටුවල නිර්දේශ මහජන කතිකාවතකට යොමු කොට අධ්‍යාපනයේ උන්නතිය සඳහා සුදුසු පරිදි ඒවා ක්‍රියාත්මක කිරීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම

- ➢ විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම
- ➢ තොරතුරු තාක්ෂණ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ උපයෝජනය හා යටිතල පහසුකම් පුළුල් කිරීම

## 2.2 දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "විශිෂ්ඨ උසස් අධ්‍යාපන පද්ධතියක්"ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂ ප්‍රමුඛතා**

➢ තරුණ භික්ෂූන් වහන්සේගේ ඉංග්‍රීසි භාෂා දැනුම, පරිගණක සහ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම  සඳහා නව අධ්‍යාපන වැඩසටහනක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

➢ පිරිවෙන් අධ්‍යාපනය නගාසිටුවීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීම

➢ භික්ෂූන්වහන්සේලා ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා පහසුකම් සැපයීම

➢ ශිෂ්‍ය භික්ෂූන්වහන්සේලාගේ අධ්‍යාපන වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මාසික අනුග්‍රාහක දායකත්ව ක්‍රමයක් හඳුන්වා දීම

➢ පරිවේණාධිපති ස්වාමීන්වහන්සේලා ගේ හා පිරිවෙන් ගුරුවරුන් ගේ නොවිසඳී ඇති පත්වීම්, වැටුප්  සහ දීමනා පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම

➢ සියළු ආගම්වලට අයත් දහම් පාසැල් කටයුතු පුළුල් කිරීම සඳහා අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම

## 2.3 කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා නියමිත නීති සහ අණපනත් වලට අදාළව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂ ප්‍රමුඛතා**

- කාන්තා සුරක්ෂිතතාවය තහවුරු කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
- නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩනයට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහනයක් ලබා දීම
- නිතර ආපදා අවදානමට ලක්වන පුද්ගලයින්ට, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්ට රැකවරණය හා පහසුකම් සැලසීමටත්, දුෂ්කරතා අවම කිරීමටත් ස්ථිර වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම
- නිරෝගී දරුවකු බිහි කිරීම, මව් සෙනෙහස තුළ දරුවන් රැක බලා ගැනීම හා දරුවන්ට මග පෙන්වීම සඳහා කාන්තාවන්ට අවශ්‍ය දැනුම, කුසලතා හා කාලය ලබා දීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම
- සියළු දරුවන්ගේ මන්දපෝෂණය නිම කිරීම සඳහා විශේෂ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අදාළ සියලු ආයතන ඒකාබද්ධව ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමා අයිතිවාසිකම් තහවුරු කිරීමට පියවර ගැනීම
- සෑම දිස්ත්‍රික් අධිකරණයකම වෙනමම අංශයක් දරුවන් සම්බන්ධව ප්‍රමාද වෙමින් ඇති සියළු නඩු විසදීම සඳහා වෙන් කිරීම
- ළමා මධ්‍යස්ථානවල සිටින දරුවන් සඳහා කැපකරු පවුල් ක්‍රමයක් ඇති කිරීම සඳහා ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම
- "ළමා මිතුරු පාසැල" සංකල්පය පුළුල් කිරීම
- රාජ්‍ය නියාමනය යටතේ ජාතික පෙර පාසැල් ප්‍රතිපත්තිය මත පිහිටා පෙර පාසැල් අධ්‍යාපනය පුළුල් කිරීම
- ග්‍රාමීය පාසල් සිසු ආකර්ශිත පාසල් බවට පත්කිරීම
- සියලුම පාසල්වල පන්ති කාමර හා සනීපාරක්ෂක උපකරණ, ගුරු ශිෂ්‍ය විවේකාගාර, සෞඛ්‍ය පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා විශේෂ වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම
- පාසල් පෙළපොත්, විෂයය නිර්දේශ, ගුරු අත්පොත් ආදිය තොරතුරු තාක්ෂණික ක්‍රමවේදයක් ඔස්සේ එළිදැක්වීමට පියවර ගැනීම
- පොකුරු පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම

## 2.4 නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

### ❖ කාර්යයන් හා කර්තව්‍යයන්

- අධ්‍යාපන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නිපුණතාවයෙන් සපිරි සමාජයක් සහ සුහුරු ජාතියක්" බිහි කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන හා පර්යේෂණ හා නව නිපැයුම් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### ❖ සුවිශේෂී ප්‍රමුඛතා

- අධ්‍යාපන සුදුසුකම් නොසළකා තාක්ෂණවේදය සහ උසස් වෘත්තීය අධ්‍යාපනය ලබාදීම සඳහා නව වැඩපිළිවෙළක් ආරම්භ කිරීම

- දැනට පවතින වෘත්තීය පුහුණු ආයතන විධිමත් ඇගයීමකට ලක් කර සුදුසු ආයතන සම්පූර්ණ භෞතික හා විෂයමාලා නවීකරණයක් කොට, "ධබැ ඔඍැඹ" සංකල්පය යටතේ එම ආයතන ජාලගත කර, තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීම
- රට පුරා විහිදුණු නව "තාක්ෂණික සහ කාර්මික විශ්වවිද්‍යාල විද්‍යායතන" පද්ධතියක් ආරම්භ කිරීම
- ජර්මන් කාර්මික අධ්‍යාපන ආයතනය පුළුල් කිරීම
- දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (හඛු) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි රීම හා ඊට අනුරූපව ශ්‍රීලංකා සුදුසුකම් රාමුව ිබ්‍රත) සංශෝධනය කිරීම
- වෘත්තීය අධ්‍යාපනයේ පශ්චාත් උපාධි මට්ටම් දක්වා අධ්‍යාපනය ලැබීමට අවස්ථා සලසා දීම
- වෘත්තීය අධ්‍යාපනය හා ව්‍යවසායකත්වය ඒකාබද්ධ කරමින් තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා දැනුම ඇතුළත් කොට වෘත්තීය අධ්‍යාපනයේ විෂය මාලා සංශෝධනයක් සිදු කිරීම
- විදේශ රැකියා උත්පාදනය හා විවිධාංගිකරණය පිළිබඳ අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් දේශීය හා විදේශීය
- රැකියා වෙළඳපල ඉලක්ක කර ගත් වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක් බිහි කිරීම
- අන්තර්ජාලය ආශ්‍රිතව බිහි වූ උපාංග, කෘතිම බුද්ධිමය, ජෛව තාක්ෂණය, රොබෝ තාක්ෂණය, ඔග්මන්ටඩ් රියලිටි, ක්ලවුඩ් කම්පියුටින්, නැනෝ තාක්ෂණය සහ ත්‍රිමාණ මුද්‍රණය වැනි නවීන තාක්ෂණයන් භාවිතය උපරිම තලයට ගෙන ඒම තුළින් ලංකාව නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම
- බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණවලට සම්බන්ධ දේශීය ආයතනවලට පහසුකම් සැපයීම
- පර්යේෂණ සඳහා දායක වන පෞද්ගලික ව්‍යවසායන් සඳහා බදු සහන ලබා දීම
- නවෝත්පාදන සහිත නිෂ්පාදන දේශීය සන්නාමයක් යටතේ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය දේශීය/ විදේශීය ආයෝජකයින් හඳුන්වා දීම
- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ආයෝජකයින් හා අදාළ භාවිතා කරන්නන් වෙත යොමු වීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණවලට සම්බන්ධ දේශීය ආයතනවලට පහසුකම් සැපයීම
- පර්යේෂණ සඳහා දායක වන පෞද්ගලික ව්‍යවසායන් සඳහා බදු සහන ලබා දීම
- නවෝත්පාදන සහිත නිෂ්පාදන දේශීය සන්නාමයක් යටතේ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය දේශීය/ විදේශීය ආයෝජකයින් හඳුන්වා දීම
- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ආයෝජකයින් හා අදාළ භාවිතා කරන්නන් වෙත යොමු වීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම

## 3. සෞඛ්‍ය අමාත්‍යාංශය

### ❖ විෂය පථය

➢ කායික, මානසික, සාමාජීය සුවතාව මෙන්ම, ආධ්‍යාත්මික සුවතාව ද ඉලක්ක කර ගනිමින් ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් මත පදනම්ව බටහිර මෙන්ම දේශීය වෛද්‍ය ක්‍රම උපයෝගීතාවය තුළ නිරෝගිමත් ජනතාවක් බිහි කිරීම සඳහා කටයුතු කිරීම.

### ❖ කාර්යයන් හා කර්තව්‍යයන්

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "නිරෝගිමත් ජනතාවක්" බිහිකිරිම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව සෞඛ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති, සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

➢ කොවිඩ් -19 කාර්ය සාධන බලකාය මගින් කොවිඩ් - 19 වසංගත උවදුරට ලක්විය හැකි අවදානම් නිරන්තරයෙන් හඳුනාගෙන ඒවා වැලැක්වීමේ කටයුතු සිදු කිරීම

### ❖ සුවිශේෂී ප්‍රමුඛතා

➢ බෝවන රෝග මෙන්ම බෝනොවන රෝග වලක්වා ගනිමින් ජනතාවගේ ජීවිත අපේක්ෂාව ගුණාත්මක වශයෙන් ඉහළ නැංවීම හා ළදරු හා මාතෘ මරණ අවම රටක් ලෙස පවත්වා ගැනීම ඉලක්ක කරගත් සෞඛ්‍ය සේවාවක් ගොඩ නැගීම

➢ පුද්ගලික වෛද්‍ය සේවාවන් හා පරීක්ෂණාගාර කටයුතු ජාතික ප්‍රතිපත්තියක් තුළ නියාමනය කිරීම සහ විධිමත් සේවාවක් ලබා දිම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම

➢ තොරතුරු තාක්ෂණ ආයතන හා සම්බන්ධව තොරතුරු තාක්ෂණය භාවිතය මගින් හා කාර්ය මණ්ඩලය සහ යටිතල පහසුකම් සැපයීම හරහා රෝගීන් සඳහා වන පොරොත්තු ලේඛණ, දිගු පෝලිම් හා තදබදය අවම කිරීමට පියවර ගැනීම

➢ කොළඹ ජාතික රෝහල ජාත්‍යන්තර මට්ටමට උසස් කිරීම

➢ සෑම දිස්ත්‍රික්කයකම එක් රෝහලක් ජාතික රෝහල මට්ටමටම වැඩි දියුණු කිරීම හා දිස්ත්‍රික් තුළ ඇති අනෙකුත් ප්‍රාදේශීය හා ප්‍රාථමික රෝහල් පහසුකම් පුළුල් කිරීම

➢ සියළුම රෝහල් සඳහා අත්‍යාවශ්‍ය භෞතික හා මානව සම්පත් සැපයීම සහ එම රෝහල් මගින් අදාල රෝගීන් නියමිත රෝහල් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම

## 3.1 ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

### කාර්යයන් හා කර්තව්‍යයන්

සෞඛ්‍ය අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත, නිරෝගිමත් ජනතාවක්, බිහිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා අදාළ ප්‍රත්පත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් ක්රීම හා ඇගයීම.

### සුවිශේෂී ප්‍රමුඛතා

1. කොවිඩ්-19 සහ වෙනත් බෝවන රෝග පාලනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හා සම්බන්ධීකරණයෙන් සියලු පළාත් හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සමග ඒකාබද්ධ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
2. වසංගත රෝග ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා කටයුතු කිරීම සහ මාතෘ හා ළදරු මරණ අවම රටක් ලෙස පවත්වා ගැනීමට මාතෘ හා ළදරු සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම.
3. ග්‍රාමීය ජනතාවට පහසුවෙන් තම සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට හැකිවන පරිදි සියලුම ප්‍රාදේශීය හා ප්‍රාථමික රෝහල්වල වෛද්‍ය, හෙද හා ආශ්‍රිත අනෙකුත් සහායක පහසුකම් වැඩි දියුණු කිරීම.
4. දරුවන්ගේ ප්‍රතිශක්තීකරණය වැඩි කිරීම සඳහා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
5. ප්‍රාථමික සෞඛ්‍ය සේවා හා මූලික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.
6. ජනතාවගේ සෞඛ්‍ය අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන හා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
7. ග්‍රාමීය, පසුගාමී හා නාගරික ප්‍රදේශවල අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින් වැඩිහිටි සෞඛ්‍ය අවශ්‍යතා පහසුකම් පුළුල් කිරීම.
8. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, පවුල් සෞඛ්‍ය සේවා, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන සතු ඩිස්පැන්සරි හා මාතෘ සායන සම්බන්ධීකරණය කරමින්, අඩු ආදායම්ලාභී සහ ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම.

## 3.2 දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය

- **කාර්යයන් හා කර්තව්‍යයන්**
  - සෞඛ්‍ය අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නීරෝගීමත් ජනතාවක්" බිහිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ සුවිශේෂී ප්‍රමුඛතා

- ජාතික දේශීය වෛද්‍ය සභාවක් හා ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවක් ලියාපදිංචි කිරීම හා දේශීය වෙද මහතුන් දේශීය වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයක් සැකසීම.
- ආයුර්වේද විද්‍යායතනයට පොදු විශ්වවිද්‍යාල පිළිගැනීමක් ඇති කිරීම.
- දේශීය ආයුර්වේද ඖෂධ සංග්‍රහය යාවත්කාලීන කිරීම.
- සංචාරකයින් සඳහා ප්‍රතිකාර කිරීමට දේශීය පාරම්පරික හා ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් සංචාරක මණ්ඩලයේ සම්බන්ධීකරණය හා නියාමනය තුළ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
- දේශීය වෛද්‍ය විද්‍යාවට අදාළ ඖෂධ සහ ප්‍රතිකාර ක්‍රම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම දිරි ගැන්වීම.
- ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සඳහා ඖසු පැළෑටි දේශීයව වගා කිරීම සඳහා දේශීය වෛද්‍යවරුන් සහ මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ ව්‍යාපාරිකයින්ගේ සහභාගීත්වයෙන් ඖසු පැළ වගා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම.
- වස විසෙන් තොර නිරෝගී ආහාර පරිභෝජනය සියලු වයස් කාණ්ඩ අතර ප්‍රචලිත කිරීම සඳහා සමෘද්ධි හා ගෘහ ආර්ථිකයන් ඉලක්ක කරගත් වැඩසටහන් පුළුල් කිරීම.
- බෝවන රෝග වැළැක්වීම හා බෝවන රෝග කලින් හඳුනා ගැනීම සඳහා දිවයින පුරා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 3.3 ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- සෞඛ්‍ය අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නීරෝගීමත් ජනතාවක්" බිහිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- ඖෂධවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශවලට යටත්ව රසායනාගාර පහසුකම් පුළුල් කිරීම
- ප්‍රමිතියෙන් යුත් ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා වෙළෙඳපළ තුළ පාරිභෝගික සුරක්ෂිතතාව ආරක්ෂා වන මිල ගණන් ක්‍රියාත්මක වීමත්, ඖෂධ වෙළෙඳපළ ඒකාධිකාරය වැලැක්වීම සඳහාත්, ප්‍රමිතියෙන් යුත් ඖෂධ සැල් (ෂය්රප්ජහ) ප්‍රවර්ධනය සඳහා නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම
- ඖෂධ නිෂ්පාදනය සඳහා දේශීය ව්‍යාපාරිකයන් හා ආයෝජන දිරිගැන්වීමේ ක්‍රමෝපායන් සකස් කිරීම.

## 4. ප්‍රවාහන අමාත්‍යාංශය

**විෂයපථය**

මගී හා භාණ්ඩ ප්‍රවාහනය, සංචාරක මගී පහසුකම්, අදාළ යටිතල පහසුකම්, සේවා ප්‍රමිතීන්, මාර්ග තදබද හා අනතුරු වලක්වා ගැනීමේ සමස්ථ ප්‍රවාහන සේවය පොදු කාලසටහනකට ක්‍රියාත්මක වන ජනතා විශ්වාසය තහවුරු වන ප්‍රවාහන සේවයක් පවත්වා ගැනීම, ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා මහා මාර්ග හා දුම්රිය මාර්ග පදනම් කරගත් පරිසර හිතකාමී මෙන්ම මහජන හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම.

**කාර්යයන් හා කර්තව්‍යයන්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ප්‍රවාහන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**සුවිශේෂී ප්‍රමුඛතා**

- පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති රීති සකස් කිරීම.
- පොදු ප්‍රවාහන පද්ධතිය කෙරෙහි ජනතා විශ්වාසය හා මාර්ග පහසුකම් ඇති කිරීම සඳහා ඉහළ ප්‍රමිතියක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- මාර්ග තදබදය, මගී තදබදය හා මාර්ග අනතුරු අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ, නීති රීති හඳුන්වා
- දීම.
- රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා හා දුම්රිය සේවා පොදු කාලසටහනකට අනුව ඒකාබද්ධ ආකෘතියක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණ ඊ-ටිකට් ක්‍රමයක් හඳුන්වා දීම.
- දුම්රිය හා බස්රථ නැවතුම් පළවල ආශ්‍රිත පොදු පහසුකම් හා ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය
- දුම්රිය හා බස්රථ සේවාව සඳහා අවශ්‍ය දුම්රිය හා බස්රථ නඩත්තු කිරීම.
- බස් රථ නිෂ්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැගීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- කොළඹ, හම්බන්තොට, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමල වරායන් වෙත දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.

- තොරතුරු තාක්ෂණයේ යෙදීම මගින් මෝටර් රථ ලියාපදිංචිය ජනතා හිතකාමී, කාර්යක්ෂම, දූෂණයෙන් තොර ක්‍රියාවලියක් බවට පත්කිරීම.

## 4.1 වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

**කාර්යයන් හා කර්තව්‍යයන්**

ප්‍රවාහන අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

**සුවිශේෂී ප්‍රමුඛතාවන්**

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලාභ උපයන ආයතනයක් බවට නවීකරණය කිරීම හා ප්‍රධාන බස් නැවතුම්පොළවල්වල පොදු පහසුකම් සංවර්ධනය කිරීම.

2. වත්මන් බස් සංචිතය ප්‍රතිස්ථාපනය කර කොළඹ හා ප්‍රධාන නගර සීමාව තුළ ධාවනය කිරීම සඳහා පරිසර හිතකාමී නව බස් රථ හඳුන්වාදීම සහ පුද්ගලික මගී ප්‍රවාහනය ද හරිත ප්‍රවාහයට අනුකූල කර ගැනීම සඳහා වැඩපිළිවෙල සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

3. දුම්රිය මැදිරි, බස් රථ, මෝටර් රථ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම, අළුත්වැඩියා කිරීම හා වැඩි දියුණු කිරීමට ආයෝජකයින් දිරිගන්වන ප්‍රවාහන සේවාවක් ගොඩනැගීම.

4. පාසල් බස් රථ සේවා හා සිසුන්ගේ ආරක්ෂාව සැලසෙන ප්‍රමිතීන් යටතේ ශක්තිමත් කිරීම.

5. ග්‍රාමීය ප්‍රදේශ වෙත පොදු ප්‍රවාහන පහසුකම් ලබා දීම ක්‍රමවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොමු කිරීම.

6. මගී හා ප්‍රවාහන සේවක ආරක්ෂාව තහවුරු වන පරිදි ප්‍රවාහන සේවාවන් ඉහළ ප්‍රමිතියක් තුළ නියාමනය කිරීම.

7. රියැදුරු බලපත් නිකුත් කිරීමේ හා මෝටර් රථ ලියාපදිංචි කිරීමේදී සිදුවන විවිධ අක්‍රමිකතා ඉවත්කොට කාර්යක්ෂම සේවාවක් ලබා දීම

## 5. වෙළඳ අමාත්‍යාංශය

❖ විෂයපථය

➢ පාරිභෝගිකයින් ගේ අයිතීන් ආරක්ෂා කරමින් තරඟකාරී දේශීය වෙළඳ ජාලයක් හරහා ජනතාව වෙත අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා දීම සඳහා කටයුතු කිරීම

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

❖ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "පාරිභෝගික ආරක්ෂණය සහ සක්‍රීය සමූපකාර ව්‍යාපාරයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වෙළඳ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ සුවිශේෂී ප්‍රමුඛතාවන්

➢ වෙළඳපළ අසමතුලිතතාවයන්ගෙන් මතුවන භාණ්ඩ හිඟයන් හා මිල
➢ අස්ථාවරවීම් වළක්වා ගැනීම
➢ දේශීය ගොවි නිෂ්පාදන සඳහා වෙළඳපල පුළුල් කිරීම
➢ ආනයන හා දේශීය නිෂ්පාදන මගින් වෙළඳපලේ ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ සැපයීම පුළුල් කිරීම
➢ සක්‍රීය සමූපකාර වෙළඳසැල් ජාලය පුළුල් කරමින් ජනතා කේන්ද්‍රීය විවිධ භාණ්ඩ හා සේවා මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය හා ආයතනගත කිරීම

## 5.1 සමූපකාර සේවා, අළෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

**කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ වෙළඳ අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "පාරිභෝගික ආරක්ෂණය සහ ශක්තිමත් සමූපකාර ව්‍යාපාරයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව සමූපකාර සේවා, අළෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
➢ නව තාක්ෂණය මුසුවූ ශක්තිමත් හා කාර්යක්ෂම වෙළඳ ජාලයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

**සුවිශේෂී ප්‍රමුඛතා**

➢ සමූපකාර සේවා මධ්‍යස්ථාන පද්ධතිය විවිධාංගීකරණය වූ ව්‍යාපාරික ආකෘතියක් යටතේ ලාභ ලබන ආයතන ජාලයක් බවට පත්කිරීම
➢ කෘෂිකර්මාන්තය, කිරි නිෂ්පාදන කර්මාන්තය, ධීවර කර්මාන්තය ප්‍රමුඛ දේශීය ගොවි නිෂ්පාදන සහ සුළු අපනයන භෝග වගාව වැනි ක්ෂේත්‍ර ආශ්‍රිතව පුළුල්ව පැතිරුණු දියුණු සහ ශක්තිමත් නිෂ්පාදන සමූපකාර ක්‍රමයක් ආරම්භ කිරීම සහ සමූපකාර හා සතොස වෙළඳ ජාල ඔස්සේ සෘජු වෙළඳපලක් සකස් කර දීම

- නිෂ්පාදන සමුපකාර ව්‍යාපාර මගින් තරුණ සහ කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය කිරීම සඳහා අපනයනය පදනම් කරගත් වටිනාකම් එකතු කිරීමේ ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා දිරි ගැන්වීම
- සම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය, ප්‍රාග්ධනය සහ වෙළෙඳපොළ හඳුන්වා දීමේ වගකීමත් නිෂ්පාදන සමුපකාරවලට පැවරීම
- ප්‍රාග්ධනය සැපයීම සඳහා සියළු සමුපකාර සමිතිවල දායකත්ව ලබා සමූපකාර සංවර්ධන බැංකු ජාලය ශක්තිමත් කිරීම 6. සෞඛ්‍යයට අහිතකර පාරිභෝගික භාණ්ඩ වෙළඳපලට ඇතුල්වීම වැළැක්වීමට පියවර ගැනීම
- පාරිභෝගික ද්‍රව්‍ය සඳහා සෞඛ්‍ය ආරක්ෂිත බව ද ඇතුළත්ව නියමිත ප්‍රමිතිකරණයක් ඇති කිරීම

## 5.2 ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

- **කාර්යයන් හා කර්තව්‍යයන්**

- බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම"සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- **සුවිශේෂී ප්‍රමුඛතා**

- ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පවතින ආයතනවල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මුද්‍රිත කෘති, නාට්‍ය, සිනමා, චිත්‍ර හා මූර්ති, සංගීත හා නර්තන කර්මාන්තයන් ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම
- දේශියත්වය මුල්කර ගත් කර්තෘ භාග ගෙවීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම
- අංග සම්පූර්ණ "නාට්‍ය නිකේතනයක්" ස්ථාපිත කිරීම හා කලාකරුවන් ගේ වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කෙරෙන වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම සඳහා ආයතනික ව්‍යූහයක් සැකසීම
- කලාත්මක නිර්මාණ සංරක්ෂණය සහ ප්‍රදර්ශනය සඳහා විශේෂිත පහසුකම් සැලසීම
- සාම්ප්‍රදායික සහ නූතන නර්තන ශිල්පීන්ගේ ප්‍රාසංගික ප්‍රදර්ශන අවකාශ ලබාදෙන සහ චිත්‍ර හා මූර්ති ශිල්පීන්ට ස්වකීය නිර්මාණ අලෙවි කර ගැනීමේ සංචාරක හෝටල් සහ සංචාරක ආකර්ෂණය සහිත ස්ථානවල ඉඩකඩ ලබාදීමේ වැඩපිළිවෙලවල් සංචාරක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීම
- නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග සම්බන්ධීකරණය

## 6. ජනමාධ්‍ය අමාත්‍යාංශය

❖ විෂයපථය

➢ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු, දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීමය කුසලතා සංවර්ධනයට කටයුතු කිරීම

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "විනිවිද භාවයෙන් යුතු ජනමාධ්‍ය සංස්කෘතියක් හඳුන්වාදීම" සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ජනමාධ්‍ය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, තැපැල් සේවාව ජනතා කේන්ද්‍රීය අවශ්‍යතාවයන් ඉලක්ක කරගත් සේවාවක් බවට පුළුල් කිරීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

# <u>ජාතික සම්බන්ධීකරණ අනු කමිටු වල විෂය පථය</u>

## මහජන ආරක්ෂාව හා සමාජ සංවර්ධන අනුකමිටුව

### 1. අධ්‍යාපන අමාත්‍යාංශය

❖ **විෂයපථය**

- දැනුම පදනම් කරගත් සමාජ ආර්ථිකයක් කරා ශ්‍රී ලාංකීය ජනතාව නගා සිටුවීම සඳහා තිරසර අධ්‍යාපන ක්‍රමෝපායන් මගින් ළමා මිතුරු අධ්‍යාපන,නවෝත්පාදන පදනම් කරගත් දැනුම හා විශිෂ්ඨ උසස් අධ්‍යාපන ක්‍රමයකට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා අනාගත පරපුර වෙත විවෘත කර දීම

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම, නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් සැලසුම් කරන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික ව්‍යුහය ස්ථාපිත කිරීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක්ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම

- සෑම දරුවෙකුටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහිත ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇතිකිරීම සඳහා ප්‍රතිපත්තිමය රාමුවක් ස්ථාපනය කිරීම

- පාසල් ගුරුවරුන් ගේ පරිපාලන ගැටළු ක්ෂණිකව විසඳීම සඳහා දැනට පවතින අදාළ චක්‍රලේඛ විධිවිධාන, රීති, රෙගුලාසි සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම සහ පවතින ආයතනික ව්‍යුහය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අධීක්ෂණ ඒකකයක් හරහා කටයුතු කිරීම

- පාසල් අවශ්‍යතාවය සම්බන්ධයෙන් නැවත සමීක්ෂණයක් සිදු කොට ඒ අනුව පාසල් පද්ධතිය ප්‍රතිස්ථානගත කිරීම

- ගුරුවරු අවශ්‍යතාවය පරිදි ස්ථානගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය විසඳුමක් ලබා දීම

- විෂය බාහිර ක්‍රියාකාරකම් පාසල් තුළ ප්‍රචලිත කිරීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සමඟ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ගතවන කාලය අවම කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම

- විශ්වවිද්‍යාල තුළ සහ නේවාසිකාගාරයන්හි පහසුකම් ඉහළ නැංවීමට කටයුතු කිරීම

- දේශීය හා විදේශීය රැකියා වෙළඳපල ඉලක්ක කර ගනිමින් උපාධිධාරීන් බිහි කිරීම සඳහා සමස්ථ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂයමාලා සංශෝධනය කිරීම

- විශ්වවිද්‍යාල සඳහා තොරතුරු තාක්ෂණ පහසුකම් ලබා දීම

- මහපොළ හා ශිෂ්‍යාධාර සඳහා විධිමත් ක්‍රමවේදයක් යටතේ තෝරා ගැනීම හා එහි පහසුකම් පුළුල් කිරීම

- සාගර විශ්වවිද්‍යාලය හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම

- සියළුම රාජ්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයකට පත්කිරීම සඳහා පියවර ගැනීම

- විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා පහසුකම් ඇති කිරීම

- නවක වද සංස්කෘතිය සියළු විශ්වවිද්‍යාලවලින් හා උසස් අධ්‍යාපන ආයතනවලින් තුරන් කිරීමට කටයුතු කිරීම

- සුහුරු අධ්‍යාපන විශ්වවිද්‍යාල ඇති කිරීම සඳහා පියවර ගැනීම

## 2. විදේශ අමාත්‍යාංශය

### ❖ විෂයපථය

- මිත්‍රශීලී හා නොබැඳුණු විදේශ ප්‍රතිපත්තියක් මත ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කරමින් සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතිකමය වපසරියන් තුළ ද්වි පාර්ශවික හා බහුපාර්ශවික සබඳතා ඔස්සේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුළ ඔසවා තැබීම

### ❖ කාර්යයන් හා කර්තව්‍යයන්

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "මිත්‍රශීලි සහ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව විදේශ විෂයයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

### ❖ සුවිශේෂී ප්‍රමුඛතා

- රටේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින් අන් රටවල් හා සම මිතුරු සබඳතා පවත්වා ගැනීම

- මෙතෙක් ඇතිකරගෙන ඇති ද්විපාර්ශවීය ගිවිසුම් නැවත සමාලෝචනයට ලක් කොට රටට අහිතකර කොන්දේසි සම්බන්ධයෙන් නැවත සළකා බැලීම හා ගිවිසුම් වලට එළඹීමේ දී දේශීය ආර්ථිකයට හානිකර නොවන පසුබිමක් සකස් කිරීම

- විදේශ දූත මණ්ඩල තෝරා ගැනීමේදී රටේ විදේශීය ප්‍රතිපත්තියට අනුකූලව ජනාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්ය ඉටු කිරීමට දායක වන නිර්ණායකයන් අනුව කටයුතු කිරීම හා දූත මණ්ඩල මගින් අපේක්ෂිත අරමුණු ඉටු වීම පිළිබඳ අඛණ්ඩ ඇගයීමට ලක් කිරීම

## 3. රාජ්‍ය සේවා , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

❖ **විෂයපථය**

- සියළු රාජ්‍ය සේවාවන්හි පූර්ණ ධාරිතා සංවර්ධනයක් සිදු කරමින් නව තොරතුරු තාක්ෂණික ක්‍රමෝපායන් ඔස්සේ කාර්යයන් ද්විකරණය වළක්වාලමින් සේවා දායකයින් වෙත ප්‍රශස්ථ සේවාවක් ලබා දීම හා පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් පවතින අසමානතා අවම කරමින් ජනතාව වෙත උසස් සේවා සැපයීමක් ලබා දීම

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

- ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී

- ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ඒකාබද්ධ සේවාවන්හි ආයතනික, පරිපාලන හා පිරිස් කළමනාකරණය

- පාර්ලිමේන්තුව සම්බන්ධ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාලව රජය විසින් ඉටුකළ යුතු කාර්යයන්

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- රාජ්‍ය සේවාව කඩිනම් කිරීම සඳහා දැනට රාජ්‍ය අංශයේ පවත්නා සියළුම චක්‍රලේඛ විධිවිධාන, නීති හා රෙගුලාසි, සමාලෝචනයට ලක් කොට සරල කිරීම

- ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය නිලධාරී සංකල්පයේ සිට මහජන සේවා සංකල්පය කරා රාජ්‍ය සේවය ගෙන යාම සඳහා අවශ්‍ය නීතිමය, ප්‍රතිපත්තිමය හා ආයතනික රාමුව සකස් කිරීම

- ස්වාධීන රාජ්‍ය සේවයක් ඇති කිරීම සඳහා අවශ්‍ය නව සේවා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය, සංස්ථා සහ බැංකු සේවයේ සියලුම ආයතනවල සත්භාවයෙන් යුක්තව රාජකාරියේ යෙදෙන රාජ්‍ය නිලධාරීන්ට මුක්තිය හිමි වන පරිදි අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම

- වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්ලාභීන්ට ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප ලබා දීම

- සංස්ථා, අර්ධ රාජ්‍ය, බැංකු සහ පෞද්ගලික අංශය සඳහා සේවක අර්ථසාධක අරමුදලට අමතරව දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම

- සේවා සමාලෝචනයක් සිදු කොට, අවශ්‍ය පරිදි නව සේවා ව්‍යවස්ථා හඳුන්වාදීම හා යාවත්කාලීන කිරීම

- රාජ්‍ය අංශයේ සේවක ආරවුල් විසඳීම සඳහා බේරුම්කාර ක්‍රියාවලියක් හඳුන්වාදීම

- රාජ්‍ය සේවයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වෘත්තීය සංවර්ධනය ද ඇතුළත්ව දීර්ඝ කාලීන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම

## 3.1 රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

❖ කාර්යයන් හා කර්තව්‍යයන්

- ආරක්ෂක අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සුරක්ෂිත රටක්" ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ සුවිශේෂී ප්‍රමුඛතා

- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉටු කරනු ලබන ජනතා කේන්ද්‍රීය සේවාවන් ශක්තිමත් කිරීම

- ත්‍රිවිධ හමුදා සේවයේ නියුතු, විශ්‍රාමික, මියගිය හා ආබාධිත අයවලුන්ගේ පවුල් සම්බන්ධයෙන් වන පරිපාලන, සැපයුම් හා සුබසාධන කටයුතු කිරීම

- රාජ්‍ය නොවන සංවිධාන, ජනමූල දායකත්වය හා පාරදෘශ්‍යතාවයෙන් හා සමාජ වගකීමෙන් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය නීතිමය හා ආයතනික ව්‍යූහය තුළින් නියාමනය ශක්තිමත් කිරීම.

- ආගමන හා විගමන පරිපාලන කටයුතු නවීකරණය හා කාර්‍යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම.

- ස්වාභාවික ආපදා අවදානම් කල්තබා හඳුනා ගැනීම, ආපදා වළක්වා ගැනීම, හානි අවම කිරීම හා හානිවූවන් නගා සිටුවීම කාර්යක්ෂම කිරීම සඳහා ආපදා අවදානම් කළමනාකරණ මධ්‍යස්ථාන හා සහන සේවා මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කරමින් ආයතනික ව්‍යූහයන් ශක්තිමත් කිරීම.

- ආපදා තත්ත්වයන් පිළිබඳව නිවැරදිව පුරෝකථනය කළ හැකි වන පරිදි නවීන තාක්ෂණය සහ දැනුමින් කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව සවිමත් කිරීම.

➢ ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ, නිතර ආපදාවන්ට ලක් වීමේ අවදානමක් සහිත ප්‍රදේශ, ආපදාවන්ට ලක් වූ පුද්ගලයන්, දේපල, ව්‍යාපාර සහ කෘෂිකාර්මික ඉඩම් ආදී සියළු තොරතුරු ඇතුළත් "ජාතික ආපදා දත්ත ගබඩාවක්" ස්ථාපනය කිරීම.

4. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

❖ **විෂයපථය**

➢ අභිමානවත්, තුලිත පෞරුෂත්වයකින් හෙබි, ජවසම්පන්න තරුණ ප්‍රජාවක් ඇති කිරීම, බාහිර ක්‍රියාකාරකම්වලට යොමු කරමින් සෞඛ්‍ය සම්පන්න ළමා හා තරුණ පිරිසක් බිහිකිරීම, ක්‍රීඩා හිතකාමී ජන සමාජයක්, නාගරික සංවර්ධන, සංචාරක, වාණිජ හා ජාත්‍යන්තර සබඳතා ගොඩනගන ක්‍රීඩා සංස්කෘතියක් ඇති කිරීම.

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "අභිමානවත් ජව සම්පන්න තරුණ පරපුරක් බිහිකිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණපනත්වලට අනුකූලව තරුණ හා ක්‍රීඩා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ රටේ අධ්‍යාපන, සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික පෙරදැක්මට තරුණ සහභාගීත්වයේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කිරීම.

➢ ආර්ථික ක්ෂේත්‍ර තුළ තරුණ ව්‍යවසායකයන්ට උපරිම අවස්ථා සළසා දීම සඳහා අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් හඳුන්වා දීම සඳහා ක්‍රමෝපායන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

➢ රාජ්‍ය, පෞද්ගලික සහ විදේශීය රැකියා අවස්ථාවන් සඳහා ගැළපෙන, ශ්‍රී ලාංකික තරුණයන් නිවැරදිව හඳුනා ගැනීම පහසු කිරීම සඳහා "තරුණ මානව සම්පත් දත්ත බැංකුවක්" ආරම්භ කිරීම.

➢ ජාත්‍යන්තර, ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාවන් සඳහා කුසලතා සංවර්ධනය පුළුල් කිරීම.

➢ ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය හා සංචාරක, නාගරික ක්‍රියාකාරකම්, ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගන ක්‍රීඩා ආර්ථිකයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම.

➢ ශ්‍රී ලාංකීය තරුණ තරුණියන් තුළ විවිධ කුසලතාවයන් පිරි ක්‍රීඩා සහභාගීත්වයක් ඇති කර ජාත්‍යන්තර ක්‍රීඩක පරිසරයක් බිහිකිරීම.

➢ ක්‍රීඩා සමිති සංවිධාන හා ව්‍යාපාරික ප්‍රජාව ක්‍රීඩා තරගාවලි (ැඩැබපී) සඳහා දිරි ගැන්වීම.

➢ සෞඛ්‍ය සම්පන්නභාවය ඉහළ නැංවීම සඳහා ශාරීරික ව්‍යායාම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩි

දියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ හා දිරි ගැන්වීම් ලබා දීම.

## 4.1 ග්‍රාමීය පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ජවසම්පන්න පරපුරක් බිහිකිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ තාරුණ්‍යයේ ජවය සමාජ විරෝධී අංශ වෙත යොමුවීම වළක්වමින් පාසල් අධ්‍යාපනයේ සිට විෂය බාහිර ක්‍රියාකාරකමක් වශයෙන් ද, යෞවන සමාජ, ක්‍රීඩා සමාජ හරහා ද, ක්‍රීඩා කටයුතු තාරුණ්‍ය වෙත හඳුන්වා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම

➢ අධ්‍යාපනයට අමතරව ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා සඳහා පාසල් දරුවන් ආකර්ශණය කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න ළමා පරපුරක් සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

➢ දිවයින පුරා විසිරී ඇති ග්‍රාමීය පාසල්වල ක්‍රීඩාවට දක්ෂතා දක්වන දරුවන් කුඩා කාලයේ සිට ම හඳුනාගෙන ඔවුන් ගේ කුසලතාවයන් ජාත්‍යන්තර මට්ටම දක්වා ගෙනඒමට අවශ්‍ය නිසි පෝෂණය සහ පුහුණුව ඇතුළු පහසුකම් සපයන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

➢ ක්‍රීඩා උපදේශකයන්, පුහුණුකරුවන් සහ භෞත චිකිත්සකයින් වැනි ක්‍රීඩාවේ දියුණුවට අවශ්‍ය සම්පත්දායකයන් බිහිකිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

➢ දිවයින පුරා පිහිටි ක්‍රීඩාගාර හා ක්‍රීඩා භූමි පිළිගත් ප්‍රමිතිකරණයට ලක් කොට ඒවා ඊට ගැළපෙන අයුරින් සංවර්ධනය කිරීම

➢ දේශීය සම්ප්‍රදායික ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා වැඩපිළිවලක් සකස් කිරීම

➢ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රීඩා අධ්‍යාපනය පුළුල් කිරීම

## 5. අධිකරණ අමාත්‍යාංශය

❖ **විෂයපථය**

➢ ජනතාවගේ පරමාධිපත්‍ය බලය ප්‍රමුඛත්වය තබා ක්‍රියාත්මක කරන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු හා නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කරමින්, නීතිය වෙත ප්‍රවිෂ්ඨ වන හා නීතියේ රැකවරණය සැමට සර්ව සාධාරණ වන සේ කටයුතු කිරීම උදෙසා නෛතිකමය පසුබිම සකස් කිරීම හා භෞතික පහසුකම් සලසාලීම

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදුකර ඇති ව්‍යාකූලතාවයන් නිවැරදි කරමින් ජනතා පරමාධිපත්‍ය තහවුරු වන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හා "නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීම සඳහා" අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව අධිකරණ විෂයයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යාකූලතාවයන් ඉවත් කරමින් ජනතා පරමාධිපත්‍ය, ජාතික ආරක්ෂාව, සියළු පාර්ශව ආවරණය වන ආර්ථික සංවර්ධනය, මානව හිමිකම් හා නීතියේ ආධිපත්‍ය සහ රටේ ස්වෛරීත්වය ආරක්ෂා වන පරිදි ව්‍යවස්ථා සංශෝධනය කිරීම

➢ රටේ නීතිය, ජාත්‍යන්තර නීතිය සමඟ ජාතික අනන්‍යතාවය හා ස්වෛරීත්වය රැකෙන පරිදි අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම 3. යල්පැනගිය නීති, ක්‍රියාපටිපාටි හා අණපනත් සංශෝධනය සඳහා සියළුම ආයතන සම්බන්ධීකරණයෙන් වැඩපිළිවෙලක් සකස්

➢ කිරිම හා ක්‍රියාත්මක කිරීම

➢ අධිකරණ ක්ෂේත්‍රයට අවශ්‍ය යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනය හා අධිකරණ පද්ධතියේ ප්‍රමාදයන් වළක්වාලීම සඳහා නවීන තාක්ෂණයේ උපයෝගීතාවය ද යොදා ගනිමින් සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම

➢ සිවිල් ආරවුල්, අධිකරණය දක්වා නොගොස් විසඳා ගැනීම සඳහා සමථ මණ්ඩල ක්‍රියාවලිය බල ගැන්වීම

➢ නීතිය ක්‍රියාක්මක කිරීමේ පටිපාටි සහ යාන්ත්‍රණය පිලිබඳ අදාල පුද්ගලයන්ට අවශ්‍ය නවීන දැනුම හා තාක්ෂණික පුහුණුව ලබා දීම

➢ අධිකරණ පද්ධතිය සහ ආයතන අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වාදීම සදහා තොරතුරු තාක්ෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය

## 5.1 බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ අධිකරණ අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ ජනාධිපති කාර්යසාධක බලකාය හා එක්ව බන්ධනාගාර තුළ සිදුවන සමාජ විරෝධී ක්‍රියා තුරන් කිරීම සඳහා පියවර ගැනීම

➢ ජනාධිපති කාර්යසාධක බලකාය හා එක්ව බන්ධනාගාර යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම

➢ බන්ධනාගාරය තුළ අපරාධකරුවන් අධීක්ෂණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම

➢ සිරකරුවන් ගේ තදබදය අඩු කිරීම සඳහා පොදු සමාව දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම

➢ සිරකරුවන් පුනරුත්ථාපනය සඳහා පුළුල් ක්‍රමවේදයක් සකස් කිරීම

➢ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, සේවක පරිපාලන ගැටළු කඩිනමින් විසඳීම

# 6. මහජන ආරක්ෂක අමාත්‍යාංශය

❖ **විෂයපථය**

සියලුම පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව නිදහසේ ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම මගින් මහජන ආරක්ෂාව තහවුරු කිරීම හා නීතිය හා සාමය පවත්වා ගැනීම.

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ''මහජන ආරක්ෂාව තහවුරු කිරීම '' සඳහා නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව මහජන ආරක්ෂක විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ මහජන ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීම.

➢ ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුභ සාධනය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම.

➢ සමාජය මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් කර ගැනීමේ වැඩපිළිවෙළ ප්‍රජා මට්ටමෙන් මෙන්ම පාසැල් හා අධ්‍යාපන ආයතනවල දරුවන් රාජ්‍ය හා පෞද්ගලික සේවා ස්ථාන ඉලක්කගත වැඩසටහන්, ආගමික මධ්‍යස්ථාන, සමාජ සංවිධාන රාජ්‍ය හා පෞද්ගලික අංශ සමගින් ක්‍රියාත්මක කිරීම.

➢ අභ්‍යන්තර ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් අන්තවාදය හා ත්‍රස්තවාදී කටයුතු වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

➢ ජන ජීවිතය සුරක්ෂිතව පවත්වා ගැනීම සඳහා මංකොල්ලකෑම්, මිනීමැරීම්, සමාජ විරෝධී ක්‍රියාවන් හා අපරාධ මර්ධනය කිරීම හා මැඩපැවැත්වීම.

➢ රටේ සියළුම පුරවැසියන්ට, විශේෂයෙන්ම කාන්තාවන්ට හා දරුවන්ට නිදහසේ තම ජීවිත ගත කිරීමට අවශ්‍ය රැකවරණය සැමවිටම පවත්වාගෙන යෑම.

➢ රථ වාහන භාවිතයේදී මාර්ගවල සිදුවන අක්‍රමිකතා මෙන්ම මාර්ග අනතුරු සිදුවන මරණ, ආබාධ, රෝහල් ගතවීම් වලක්වා ගැනීම හා අවිධිමත් හා නොසැලකිලිමත් රිය පැදවීම් මංතීරු හා මාර්ග සංඥා උල්ලංඝනය කිරීම මෙන්ම විශේෂයෙන් නාගරික ප්‍රදේශවල අවිධිමත් රිය පැදවීම් හා මග දෙපස රථවාහන නතරකර තැබීම් නිසා ඇතිවන මාර්ග තදබදය අවම කර ක්‍රමවත් රථවාහන ධාවන නියාමන ක්‍රමවේදයක් හා නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම සඳහා රථවාහන පොලීසිය ප්‍රතිසංවිධානය කර නවීන තාක්ෂණ හා ක්‍රමෝපායන් යොදාගනිමින් නවීකරණය කිරීම.

➢ බහු කාර්ය සංවර්ධන කටයුතු සඳහා දිළිඳු පවුල්වල රැකියා හා ජීවනෝපාය දායකත්වය වැඩිවන අයුරින් දිළිඳු බව තුරන් කිරීමේ කාර්යයන් සඳහා මෙන්ම අනෙකුත් සංවර්ධන ක්ෂේත්‍ර සඳහා බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකාය වෙත යොමු කිරීම.

## 7. ජාතික උරුමය, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

➢ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම"සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

➢ ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පවතින ආයතනවල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- මුද්‍රිත කෘති, නාට්‍ය, සිනමා, චිත්‍ර හා මූර්ති, සංගීත හා නර්තන කර්මාන්තයන් ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම

- දේශියත්වය මුල්කර ගත් කර්තෘ භාග ගෙවීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම

- අංග සම්පූර්ණ "නාට්‍ය නිකේතනයක්" ස්ථාපිත කිරීම හා කලාකරුවන් ගේ වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කෙරෙන වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සැකසීම

- කලාත්මක නිර්මාණ සංරක්ෂණය සහ ප්‍රදර්ශනය සඳහා විශේෂිත පහසුකම් සැලසීම

- සාම්ප්‍රදායික සහ නූතන නර්තන ශිල්පීන්ගේ ප්‍රාසංගික ප්‍රදර්ශන අවකාශ ලබාදෙන සහ චිත්‍ර හා මූර්ති ශිල්පීන්ට ස්වකීය නිර්මාණ අලෙවි කර ගැනීමේ සංචාරක හෝටල් සහ සංචාරක ආකර්ෂණය සහිත ස්ථානවල ඉඩකඩ ලබාදීමේ වැඩපිළිවෙලවල් සංචාරක අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කිරීම

- නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග සම්බන්ධීකරණය

## 8. කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

❖ **කාර්යයන් හා කර්තව්‍යයන්**

- විදේශ අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "මිත්‍රශීලී සහ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය" ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව කලාපීය සහයෝගිතා කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

❖ **සුවිශේෂී ප්‍රමුඛතා**

- ආසියානු රටවල් සමග ශක්තිමත් ආර්ථික හා වෙළඳ සබඳතාපුළුල් කර ගැනීම

- සාර්ක් හා බිම්ස්ටෙක් රටවල් සමග සමීප සබඳතා ශක්තිමත් කිරීම

- මැදපෙරදිග හා ගිනිකොණ දිග ආසියාතික රටවල් සමග වෙළඳ, සංචාරක හා ආයෝජන හා රැකියා වෙළඳපොල සබඳතා ඇතිකර ගැනීම

- දේශීය කර්මාන්තකරුවන් සහ සම්ප්‍රදායික සංස්කෘතික නිර්මාණ හා දේශීය නිෂ්පාදන සඳහා විදේශ වෙළඳපල අවස්ථා නිර්මාණය සඳහා කටයුතු කිරීම

- ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයන්ට විදේශ රටවල ඇති භාණ්ඩ හා සේවා වෙළඳපළ සඳහා ඇති විවිධ බාධා ඉවත් කිරීමට සෘජු දායකත්වය ලබාදීම මෙන්ම ශ්‍රී ලංකාවේ ආයෝජන හා සංචාරක ප්‍රවර්ධනය වෙනුවෙන් එම රටවල් දායක කර ගැනීම

## 1. කෘෂිකාර්මික අනු කමිටුව

### අරමුණ

- පවත්නා සම්පත් උපයෝගී කරගෙන ප්‍රාදේශීය මට්ටමේ කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කරමින් ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනංවා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

### විෂය පථය

- තේ, පොල්, රබර්
- අපනයන භෝග
- මධ්‍ය හා මහා පරිමාණ කෘෂිකාර්මික බෝග, වී හා ක්ෂේත්‍ර බෝග ( එළවළු ,පළතුරු, බෝග වර්ග 16 )
- වනජීවී
- වන සංරක්ෂණ
- ඉඩම්
- ඉඩම් පරිහරණ
- ගොවිජන සේවා
- පොහොර බෙදාහැරීම
- වාරිමාර්ග
- පරිසර සංරක්ෂණය
- කාබනික පොහොර භාවිතය ඉහළ නැංවීම
- කෘෂි රසායනික හා කෘමිනාශක භාවිතය නියාමනය කිරීම
- කෘෂි නිෂ්පාදන අලෙවිය හා ගොවිපොළ කළමනාකරණය
- කෘෂිකාර්මික නිෂ්පාදන

### කමිටු නිලධාරීන්

- ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම්
- සහකාර අධ්‍යක්ෂ
- කලාප භාර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ
- ගොවිජන සංවර්ධන නිලධාරී
- සමෘද්ධි මූලස්ථාන කළමනාකරුවන්
- සියලුම ග්‍රාම නිලධාරීන්
- කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර
- පොල් සංවර්ධන නිලධාරී
- තේ පරීක්ෂක
- රබර් සංවර්ධන නිලධාරී
- සුළු අපනයන සංවර්ධන නිලධාරී
- කෘෂි උපදේශක
- ජාතික පොහොර ලේකම් කාර්යාලයේ නිලධාරීන්
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු නිලධාරීන්
- පරිසර නිලධාරී
- වන සංරක්ෂණ නිලධාරී
- වනජීවී සංරක්ෂණ නිලධාරී
- ඉඩම් නිලධාරී
- ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී
- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන වෙනත් නිලධාරීන්

## 2. ජීවනෝපාය අනු කමිටුව

### අරමුණ

- ප්‍රාදේශීය අනන්‍යතාවයන් සහිත ජීවනෝපායන් වැඩිදියුණු කිරීම තුළින් ප්‍රාදේශයේ ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවීම

### විෂය පථය

- ගෘහ ආර්ථික කළමනාකරණය
- කුඩා ව්‍යාපාර සංවර්ධනය
- විදේශ රැකියා
- පශු සම්පත්
- සංචාරක
- සමෘද්ධි
- මධ්‍ය හා මහා පරිමාණ ධීවර හා ජලජීවී වගාව
- නිපුණතා සංවර්ධන
- විද්‍යා හා තාක්ෂණික කටයුතු
- ව්‍යවසායකත්වය
- මල් වගාව
- ග්‍රාම සංවර්ධන
- ගෘහස්ථ කර්මාන්ත හා ස්වයං රැකියා
- ස්වේච්ඡා සංවිධානවල ආර්ථික කටයුතු
- නව නිපැයුම්
- ආහාර නිෂ්පාදනය

### අදාල නිලධාරීන්

- ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම්
- සහකාර අධ්‍යක්ෂ
- සමෘද්ධි මූලස්ථාන කළමනාකරුවන්
- ආර්ථික සංවර්ධන නිලධාරී
- සමෘද්ධි සංවර්ධන නිලධාරී
- මහජන සෞඛ්‍ය පරීක්ෂක
- විද්‍යාතා නිලධාරී
- විදේශ රැකියා සංවර්ධන නිලධාරී
- ව්‍යවසාය සංවර්ධන නිලධාරී
- වනිතා සංවර්ධන නිලධාරී
- ප්‍රජා විශෝධන නිලධාරී
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන නිලධාරී
- නිපුණතා සංවර්ධන නිලධාරී
- ජලජීවී ව්‍යාප්ත නිලධාරී
- කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරී
- මානව සම්පත් නිලධාරී
- සංවර්ධන සම්බන්ධීකාරක
- ධීවර පරීක්ෂක
- සංවර්ධන නිලධාරී ( පශු සම්පත්)
- සත්ත්ව සංවර්ධන උපදේශක
- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන වෙනත් නිලධාරීන්

## 3. යටිතල පහසුකම් අනු කමිටුව

### අරමුණ

- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ප්‍රාදේශීය වශයෙන් සංවර්ධනය කළ යුතු යටිතල පහසුකම් හඳුනාගෙන ආයතන අතර සම්බන්ධීකරණය තුළින් ඒවා වැඩිදියුණු කිරීම

### විෂය පථය

- ග්‍රාමීය මාර්ග
- ජලය
- විදුලිය
- වාරිමාර්ග
- පුනර්ජනනීය බලශක්තිය
- නිවාස
- සනීපාරක්ෂක පහසුකම්
- වෙරළ සංරක්ෂණ
- ප්‍රවාහන
- නාගරික සංවර්ධනය
- ග්‍රාමීය පොළ
- ප්‍රජා ශාලා පළාත් පාලනය යටතේ පැවරී ඇති කාර්යයන් ( කසළ කළමනාකරණය හා ප්‍රතිචක්‍රීකරණය)
- පෙර පාසල්
- දුරකථන / විදුලි සංදේශ
- ආපදා කළමනාකරණය

### අදාල නිලධාරීන්

- ප්‍රාදේශීය ලේකම් / සහකාර ප්‍රාදේශීය ලේකම්
- සහකාර අධ්‍යක්ෂ
- පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ අධිකාරී
- ප්‍රාදේශීය ඉංජිනේරු (ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය)
- මාර්ග සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
- නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
- පහත්බිම් සංවර්ධන මණ්ඩලයේ නියෝජිතයෙකු
- නගර සභා / ප්‍රාදේශීය සභා ලේකම් / නාගරික කොමසාරිස්
- පරිසර නිලධාරී
- නිවාස නිලධාරී
- සංවර්ධන නිලධාරී ( ග්‍රාම සංවර්ධන)
- ආපදා සහන සේවා සංවර්ධන නිලධාරී
- වාරිමාර්ග නිලධාරී
- වෙරළ සංරක්ෂණ සංවර්ධන නිලධාරී
- ජන හා සංඛ්‍යාලේඛණ නිලධාරී
- ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ස්ථාන භාර නිලධාරී
- ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
- විදුලි අධිකාරිගේ නියෝජිතයෙකු
- ඩිපෝ අධිකාරියේ නියෝජිතයෙකු
- ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ නියෝජිතයෙකු
- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන වෙනත් නිලධාරීන්

## 4. සමාජ යටිතල පහසුකම් අනු කමිටුව

### අරමුණ

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සියලු ජන කොටස්වලට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය, සෞඛ්‍ය සේවා ඇතුළු සියලු අත්‍යවශ්‍ය සේවා සම්පාදනය සහතික කිරීම

### විෂය පථය

- සෞඛ්‍ය ( ප්‍රජා සෞඛ්‍ය ද ඇතුළත්ව )
- මාතෘ සායන
- අධ්‍යාපනය
- ග්‍රාමීය පාසල්
- සමූපකාර
- පාරිභෝගික සේවා
- පාරිභෝගික ආරක්ෂණය
- කලා හා සංස්කෘතික

### අදාල නිලධාරීන්

- ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම්
- සහකාර අධ්‍යක්ෂ
- සහකාර සමූපකාර කොමසාරිස්
- විවිධ සේවා සමූපකාර සමිති සභාපති
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
- දේශීය ආයුර්වේද වෛද්‍ය නිලධාරී
- කලාප / කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ
- සංස්කෘතික සංවර්ධන නිලධාරී
- වනිතා සංවර්ධන නිලධාරී
- මනෝ උපදේශන සංවර්ධන නිලධාරී
- ප්‍රජා විශෝධන නිලධාරී
- පරිවාස හා ළමාරක්ෂක නිලධාරී
- බෞද්ධ කටයුතු සංවර්ධන නිලධාරී
- ළමා ආරක්ෂණ නිලධාරී
- මහජන සෞඛ්‍ය පරීක්ෂක
- සමූපකාර පරීක්ෂක
- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන වෙනත් නිලධාරීන්

## 5. මහජන ආරක්ෂාව හා සමාජ සංවර්ධන අනු කමිටුව

### අරමුණ

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ළමා, තරුණ හා වැඩිහිටියන්ගේ ආරක්ෂාව හා ආධ්‍යාත්මික සංවර්ධනයෙන් පරිපූර්ණ සමාජයක් බිහි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම

### විෂය පථය

- මහජන ආරක්ෂාව
- මත්ද්‍රව්‍ය නිවාරණය
- ක්‍රීඩා
- ආකල්ප සංවර්ධනය
- දහම් අධ්‍යාපනය
- විශේෂ අවශ්‍යතා සහිත ළමුන්
- සමාජ සුභසාධනය
- ග්‍රාමීය ප්‍රජා සංවිධාන
- ආගමික මධ්‍යස්ථාන
- ස්වේච්ඡා සංවිධාන
- තාක්ෂණ, කාන්තා හා ළමා සංවර්ධනය
- ජාතික ඒකාබද්ධතාවය

### අදාල නිලධාරීන්

- ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම්
- සහකාර අධ්‍යක්ෂ
- පොලිස් ස්ථානාධිපති
- ක්‍රීඩා නිලධාරී
- මනෝ උපදේශන නිලධාරී
- ඵලදායිතා සංවර්ධන නිලධාරී
- තරුණ සේවා නිලධාරී
- සමාජ සේවා නිලධාරී
- බෞද්ධ කටයුතු සමායෝජක
- මුල් ළමාවිය සංවර්ධන නිලධාරී
- ජාතික ඒකාබද්ධතා නිලධාරී
- ප්‍රජා විශෝධන නිලධාරී
- සමථ නිලධාරී
- වනිතා සංවර්ධන නිලධාරී
- පරිවාස හා ළමාරක්ෂක නිලධාරී
- පරිවාස නිලධාරී
- ජාතික ළමා රක්ෂක අධිකාරියේ නිලධාරී
- භාෂා සම්බන්ධීකාරක
- සංස්කෘතික නිලධාරී
- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන වෙනත් නිලධාරීන්